14

සන්න සහිත

# ආශීවිෂොපම සූත්‍රය.

සහ එහි පුරාතන

**විශෙෂාර්ථභාව සන්න**

සමෙතයි.

උගත් ස්වාමීන්වහන්සේ නමක් ලවා
ශුද්ධකරවා ගෙණ
**දොන්, බස්තියන්ද, සිල්වා සමරනායක අප්පුහාමි**
වන මා විසින්
අච්චුගස්වා ප්‍රසිද්ධකරණ ලදී.

*Printed at The "Lakrivikirana" Press,*

**COLOMBO.**

**1891.**

# විඥාපනය.

චතුර්වෛශාරද්‍යඥානයෙන් විශාරදවූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ ජේතවන මහාවිහාරයෙහි වැඩවසනසේක් එක්දිනක උග්ඝටිතඥය විපඤ්චිතඥය ඥෙයපරමය යන සියලු විනෙයජනයන්ට නිවන්සැප දෙනුපිණිස මහමෙර උපුරන්නාක්මෙන්ද මහපොළොව උපුල්කරන්නාක්මෙන්ද සිව්වනක්පිරිස්මැද මේ ආශීර්විෂොපමසූත්‍රාන්තධර්ම දෙශනාව ගෙණහැර දක්වා වදාළබව අටුවාහි කියනලදි—ඒ මේ සූත්‍රාන්තදෙශනාව සඞ්ගීතිකාරක මහාස්ථවිරයන්වහන්සේලා විසින් සංයුක්තනිකායෙහිවූ ‘මාතුගාමසංයුත්තක ආසීවිස’ වර්ගයෙහි ඇතුළත් කරණලද පළමුවෙනි සූත්‍රාන්තයකි. මෙහි ප්‍රධානවශයෙන් ප්‍රකාශවන ධර්මනම් පඤ්චස්කන්ධයන්ගේ අනිත්‍යතාව හා අෂ්ටාර්ය්‍ය පුද්ගලයන්ගේ විශෙෂ විභාග ආදීයයි.

මීට පසු බුද්ධශාසනය පිහිටුවීමපිණිස මොග්ගලිපුත්තතිස්සස්ථවිරයන් වහන්සේවිසින් ඒ ඒ රටවලට පිටත්කර යවනලද භික්ෂූන්වහන්සේලා අතුරෙන් කාස්මීර ගන්ධාර යන රටදෙකට වැඩියාවූ ආයුෂ්මත් මජ්ඣන්තිකස්ථවිරයන්වහන්සේ යථොක්ත දෙරටවැස්සන්ට මේ ආශීර්විෂොපම සූත්‍රයෙන් ධර්මදෙශනා කොට අසූදහසක් ප්‍රාණීන් ධර්මාවබොධයට පැමිණවූබැව් සහ ලඞ්කාවට පිටත්කර එව් මහාමහෙන්ද්‍රස්ථවිරයන් වහන්සේ මහමෙව්නාඋයන පිළිගන්නා තුන්වෙනි දිනයෙහි මේ සූත්‍රයෙන් එහි රැස්වූ පිරිසට ධර්මදෙශනා කොට දහසක් ප්‍රාණීහු ධර්මාභිසමයට පැමිණවූබැව් බොධිවංස, මහාවංශාදියෙහි ප්‍රකාශිතයි.

මහාවංශයෙහි—

තදා කස්මීරගන්ධාරවාසිනො මනුජා ගතා,
නාගරාජස්ස පූජත්ථං ගන්ත්වා ථෙරං මහිද්ධිකං.

ථෙරමෙවාභිවාදෙත්වා එකමන්තං නිසීදිසුං,
තෙසං ධම්මමදෙසෙසි ථෙරො ආසිවිසොපමං.

අසීතියාසහස්සානං ධම්මාභිසමයො අහු,
සතසහස්සපුරිසා පබ්බජ්ජුං ථෙරසන්තිකෙ.

තතොප්පභුති කස්මීරගන්ධාරා තෙ ඉදානිපි,
ආසුං කාසාවපජ්ජොතා වත්ථුත්තයපරායණා.

---

තතියෙ දිවසෙ ථෙරො රාජගෙහම්හි භුඤ්ජිය,
නිසජ්ජ නන්දනවනෙ දෙසෙසා'සිවිසොපමං.

පාපයිත්වාභිසමයං සහස්සපුරිසා තතො,
තිස්සාරාමං මහාථෙරො රාජා ච සුතදෙසනො—යි.

මීට පුරාණ ආචාර්ය කෙනෙකුන් විසින් කරණලද අතිමනොහර පදනත සන්නයද අන්‍යතර පණ්ඩිතමෙකු විසින් අති විස්තර උපමාදියෙන් යුක්තකොට ගළපනලද විශෙෂාර්ථ භාවසන්නයද යන පොත් දෙක පුරාණ ලිපිකරුවන්ගෙන් හටගත් දෙෂයන් ධර්මවිනයාතිදක්ෂ ස්වාමීන්වහන්සේ නමක් ලවා ශුද්ධකරවා ගෙණ මුද්‍රණය කරවන ලදී.

මේ සූත්‍රසන්නය සියලු ගෘහස්ථ ප්‍රව්‍රජිතයන්ගේ ධර්මාවබොධයට අත්‍යන්තොපකාරවත්බැව් වැඩිවශයෙන් නොලීවාට මේ සූත්‍රසන්නය ගෙණ බැලීමෙන් සුවසේ කාටත්පාහේ වැටහෙනවාඇති. මේ අවසානයෙහි පැණෙන විශෙෂාර්ථ භාවසන්නයවනාහි උඩපාත දෙරටින්ම සොයාගැණීම අති දුෂ්කරවා පමණකුත් නොව ධර්මකථික මහාස්ථවිරයන්වහන්සේලා පවා විචාළහොත් මෙය මින් පෙර නොදුටුපු නොඇසූවිරූබැව් මොනවට දනගතහැකිවේ යයි සිතමි. එහෙයින් මින් එක එක පොත රැගෙණ භාවිතකටයුතුබැව් සඟ මෙබඳු පොත් පත් බැලීමෙන් ධර්මය දැන ඒවූ පරිද්දෙන් පිළිපැද උතුම්වූ නිර්වාණ සම්පත්තිය අත්පත්කර ගතයුතුහි.

මෙහි යම් ප්‍රමාද භ්‍රමාදියෙන් ජනිත දෙෂයන් විද්‍යමානවුවහොත් එය ශාසනාලයෙන් ප්‍රාඥයෝ සමාධිය භජනය කෙරෙත්වා.

මෙය නැවත නැවතත් අච්චුගැස්වීමේ අයිතිවාසිකම මෙහි පහත අත්සන්කරණ මටම තබාගත්බැව් දතයුතු.

*D. B. D. S. Samaranayaka*
*Appuhami.*

# ආසීවිසොපමසුත්තං.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ—තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

සෙය්‍යථාපි භික්ඛවෙ චත්තාරො ආසීවිසා උග්ගතෙජා ඝොරවිසා, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො, තමෙනං එවං වදෙය්‍යුං ඉමෙ තෙ අම්භො පුරිස චත්තාරො ආසීවිසා උග්ගතෙජා ඝොරවිසා කාලෙන කාලං උපට්ඨාපෙතබ්බා කාලෙන කාලං නහාපෙතබ්බා කාලෙන කාලං භොජෙතබ්බා කාලෙන කාලං සංවෙසෙතබ්බා යදා ච ඛො තෙ අම්භො පුරිස ඉමෙසං චතුන්නං ආසීවිසානං උග්ගතෙජානං ඝොරවිසානං අඤ්ඤතරො වා අඤ්ඤතරො වා කුප්පිස්සති තතො ත්වං අම්භො පුරිස මරණං වා නිගච්ඡිස්සසි මරණමත්තං වා දුක්ඛං, යන්තෙ අම්භො පුරිස කරණීයං තං කරොහී'ති—අථ ඛො සො භික්ඛවෙ පුරිසො භීතො චතුන්නං ආසීවිසානං උග්ගතෙජානං ඝොරවිසානං යෙන වා තෙන වා පලායෙථ. තමෙනං එවං වදෙය්‍යුං ඉමෙ තෙ අම්භො පුරිස පඤ්ච වධකා පච්චත්ථිකා පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා යත්ථෙව නං පස්සාම තත්ථෙව ජීවිතා වොරොපෙස්සාමා'ති, යන්තෙ අම්භො පුරිස කරණීයං තං කරොහී'ති—අථ ඛො සො භික්ඛවෙ පුරිසො භීතො චතුන්නං ආසීවිසානං උග්ගතෙජානං ඝොරවිසානං භීතො පඤ්චන්නං වධකානං පච්චත්ථිකානං යෙන වා තෙන වා පලායෙථ. තමෙනං එවං වදෙය්‍යුං යන්තෙ අම්භො පුරිස ඡට්ඨො අන්තරචරො වධකො උක්ඛිත්තාසිකො පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධො යත්ථෙව නං පස්සිස්සාමි තත්ථෙව සිරං වා පාතෙස්සාමී'ති, යන්තෙ අම්භො පුරිස කරණීයං තං කරොහී'ති—අථ ඛො සො භික්ඛවෙ පුරිසො භීතො චතුන්නං ආසීවිසානං උග්ගතෙජානං ඝොරවිසානං භීතො පඤ්චන්නං වධකානං පච්චත්ථිකානං භීතො ඡට්ඨස්ස අන්තරචරස්ස වධකස්ස උක්ඛිත්තාසිකස්ස යෙන වා තෙන වා පලායෙථ. සො පස්සෙය්‍ය

සුඤ්ඤං ගාමං යඤ්ඤදෙව ඝරං පවිසෙය්‍ය රිත්තකඤ්ඤෙව
පවිසෙය්‍ය තුච්ඡකඤ්ඤෙව පවිසෙය්‍ය සුඤ්ඤකඤ්ඤෙව පවි
සෙය්‍ය—යඤ්ඤෙව භාජනං පරිමසෙය්‍ය රිත්තකඤ්ඤෙව පරිමසෙ
ය්‍ය තුච්ඡකඤ්ඤෙව පරිමසෙය්‍ය සුඤ්ඤකඤ්ඤෙව පරිමසෙය්‍ය
තමෙනං එවං වදෙය්‍යුං ඉදානම්භො පුරිස ඉමං සුඤ්ඤං ගාමං
චොරා ගාමඝාතකා වධිස්සන්ති යන්තෙ අම්භො පුරිස කරණී
යං තං කරොහී'ති—අථ ඛො සො භික්ඛවෙ පුරිසො භීතො
චතුන්නං ආසීවිසානං උග්ගතෙජානං ඝොරවිසානං භීතො ප
ඤ්චන්නං වධකානං පච්චත්ථිකානං භීතො ඡට්ඨස්ස අන්තරචර
කස්ස වධකස්ස උක්ඛිත්තාසිකස්ස භීතො චොරානං ගාමඝාත
කානං යෙනවා තෙනවා පලායෙථ. සො පස්සෙය්‍ය මහන්තං
උදකණ්ණවං ඔරිමං තීරං සාසඞ්කං සප්පටිභයං පාරිමං තීරං
ඛෙමං අප්පටිභයං නචස්සා නාවා සන්තාරණී උත්තරසෙතු වා
අපරාපරං ගමනාය—අථ ඛො භික්ඛවෙ තස්ස පුරිසස්ස එවම
ස්ස, අයං ඛො මහා උදකණ්ණවො ඔරිමංච තීරං සාසඞ්කං ස
ප්පටිභයං පාරිමං තීරං ඛෙමං අප්පටිභයං නත්ථිච නාවා ස
න්තාරණී උත්තරසෙතු වා අපරාපරං ගමනාය, යන්නූනාහං
තිණකට්ඨසාඛාපලාසං සංකඩ්ඪිත්වා කුල්ලං බන්ධිත්වා තං කු
ල්ලං නිස්සාය හත්ථෙහි ච පාදෙහි චවායම මානො සොත්ථිනා
පාරං ගච්ඡෙය්‍යන්ති—අථ ඛො සො භික්ඛවෙ තිණකට්ඨසාඛා
පලාසං සංකඩ්ඪිත්වා කුල්ලංබන්ධිත්වා තං කුල්ලං නිස්සාය
හත්ථෙහි ච පාදෙහි ච වායමමානො සොත්ථිනා පාරං ගච්ඡෙ
ය්‍ය තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

උපමා ඛො ම්‍යායං භික්ඛවෙ කතා අත්ථස්ස විඤ්ඤාපනාය, අයං
චෙවෙත්ථ අත්ථො චත්තාරො ආසීවිසා උග්ගතෙජා ඝොරවිසා
'ති ඛො භික්ඛවෙ චතුන්නෙතං මහාභූතානං අධිවචනං පඨවි
ධාතුයා ආපොධාතුයා තෙජොධාතුයා වායොධාතුයා—පඤ්ච
වධකා පච්චත්ථිකා'ති ඛො භික්ඛවෙ පඤ්චන්නං උපාදානක්ඛ
න්ධානං අධිවචනං සෙය්‍යථීදං? රූපූපාදානක්ඛන්ධස්ස වෙදනූ
පාදානක්ඛන්ධස්ස සඤ්ඤූපාදානක්ඛන්ධස්ස සඞ්ඛාරූපාදානක්ඛ
න්ධස්ස විඤ්ඤාණූපාදානක්ඛන්ධස්ස—ඡට්ඨො අන්තරචරො වධ
කො උක්ඛිත්තාසිකො'ති ඛො භික්ඛවෙ නන්දිරාගස්සෙතං අධි
වචනං—සුඤ්ඤං ගාමං'ති ඛො භික්ඛවෙ ඡන්නං අජ්ඣත්තිකානං
ආයතනානං අධිවචනං චක්ඛුතො චෙපි නං භික්ඛවෙ පණ්ඩි
තො ව්‍යත්තො මෙධාවී උපපරික්ඛති රිත්තකඤ්ඤෙව ඛායති
තුච්ඡකඤ්ඤෙව ඛායති සුඤ්ඤකඤ්ඤෙව ඛායති සොතතො
චෙපිනං භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී උපපරික්ඛති

රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති සුඤ්ඤකඤ්ඤෙව ඛායති ඝාණතොචෙපි නං භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී උපපරික්ඛති රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති සුඤ්ඤකඤ්ඤෙව ඛායති ජිව්හාතො චෙපි නං භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී උපපරික්ඛති රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති සුඤ්ඤකඤ්ඤෙව ඛායති කායතො චෙපි නං භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී උපපරික්ඛති රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති සුඤ්ඤකඤ්ඤෙව ඛායති මනතොචෙපි නං භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී උපපරික්ඛති රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති සුඤ්ඤකඤ්ඤෙව ඛායති චොරා ගාමඝාතකා'ති ඛො භික්ඛවෙ ඡන්නං බාහිරානං ආයතනානං අධිවචනං. චක්ඛුං භික්ඛවෙ හඤ්ඤති මනාපා මනාපෙසු රූපෙසු, සොතං හඤ්ඤති මනාපා මනාපෙසු සද්දෙසු, ඝාණං හඤ්ඤති මනාපා මනාපෙසු ගන්ධෙසු, ජිව්හා හඤ්ඤති මනාපා මනාපෙසු රසෙසු, කායො හඤ්ඤති මනාපා මනාපෙසු ඵොට්ඨබ්බෙසු, මනො හඤ්ඤති මනාපා මනාපෙසු ධම්මෙසු මහා උදකණ්ණවො'ති ඛො භික්ඛවෙ චතුන්නං ඔඝානං අධිවචනං කාමොඝස්ස භවොඝස්ස දිට්ඨොඝස්ස අවිජ්ජොඝස්ස ඔරිමං තීරං සාසඞ්කං සප්පටිභයං 'ති ඛො භික්ඛවෙ සක්කායස්සෙතං අධිවචනං, පාරිමං තීරං ඛෙමං අප්පටිභයන්ති'ඛො භික්ඛවෙ නිබ්බාණස්සෙතං අධිවචනං, කුල්ලන්ති'ඛො භික්ඛවෙ අරියස්සෙතං අට්ඨඞ්ගිකස්සමග්ගස්ස අධිවචනං සෙය්‍යථීදං? සම්මාදිට්ඨියා සම්මාසංකප්පස්ස සම්මාවාචාය සම්මාකම්මන්තස්ස සම්මාආජීවස්ස සම්මාවායාමස්ස සම්මාසතියා සම්මාසමාධිස්ස- හත්ථෙහිච පාදෙහිච වායාමො'ති ඛො භික්ඛවෙ විරියාරම්භස්සෙතං අධිවචනං, තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො'ති ඛො භික්ඛවෙ අරහතො එතං අධිවචනං'ති.

ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ආසීවිසොපම සුත්තං

නිට්ඨිතං.

——00——

ස න් න ස හි ත

# ආසිවිසොපම සූත්‍රය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

මෙ, ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්ස මාවිසින් විශුද්ධබුද්ධීන් ප්‍රසිද්ධ බෞද්ධවිද්ගද්ධජනප්‍රමුඛ සකලශ්‍රොතෘජනමන ප්‍රසාදදායක සකලසුරනර කර්ණරසායනවූ මේ ආශිවිෂොපම සූත්‍රාන්තධර්මදෙශනාව; එවංසුතං, මෙයාකාරයෙන් අසනලද මෙසේම් අසනලදී; එකංසමයං, ගර්භාවක්‍රාන්තිසමයාදි එක් සමයෙක්හි; භගවා, සතපුණ්‍යලක්‍ෂණධරත්වාදි භාග්‍යයෙන් යුක්තවූ සම්‍යක්සම්බුද්ධසර්වඥරාජෝත්තමයන්වහන්සේ; සාවත්ථියං, ශ්‍රාවස්තිනම් පුරප්‍රවරයෙහිවූ; ජෙතවනෙ, ජෙතවනනම්වූ; අනාථපිණ්ඩිකස්සආරාමෙ, අනේපිඩු මහසිටුහුගේ අරම්හි; විහරති, වාසයකරණසේක-තත්‍රඛො, ඒ ජෙතවන මහවිහාරයෙහි වාසය කරන්නාවූ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; භික්ඛවොති, මහණෙනි කියා; භික්ඛූ අමන්තෙසි, භික්ෂූන්ට ආමන්ත්‍රනයකොට වදාළසේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භදන්තෙති, කිමෙක්ද ස්වාමිනි කියා; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචන දුන්නාහුය; භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං; මේ මතුකියන වචනය; අවොච, වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; උග්ගතෙජා, උග්‍රවූ තෙජස් ඇත්තාවූ; ඝොරවිසා, දරුණු විෂඇත්තාවූ; චත්තාරො ආසිවිසා, ආශිවිෂයෝ සතරදෙනෙක්; සෙය්‍යථාපි, යම්සේ(ප්‍රත්‍යන්තදෙශයෙහි රජුන්විසින් පොෂ්‍යකරණලද්දාහුවෙද්ද) අථ, ඉක්බිත්තෙන්; ජීවිතුකාමො, ජීවත්වනුකැමත්තාවූ; අමරිතුකාමො, මරණ නොකැමැත්තාවූ; සුඛකාමො, සෞඛ්‍යාභිලාසීවූ හෙවත් සැපකැමැත්තාවූ; දුක්ඛපටික්කූලො, දුඃඛයට ප්‍රතිකූලවූ; පුරිසො, පුරුෂයෙක්; ආගච්ඡෙය්‍ය, ආයේද; තමෙනං, ඒ පුරුෂයාහට; එවං වදෙය්‍යුං, මෙසේ කියන්නාහුවෙති; අම්භොපුරිස, එම්බල පුරුෂය; ඉමෙචත්තාරො ආසිවිසා, මේ ආශිවිෂයෝ සතර

දෙනා; උග්ගතෙජා, උග්‍රවූ තෙජස්ඇත්තාහුය; ඝොරවිසා, දරු
ණුවූ විෂඇත්තාහුය; කාලෙනකාලං, කලින්කලට; වුට්ඨාපෙ
තබ්බා, නැගීසිටවියයුත්තාහ; කාලෙනකාලං, කලින්කලට;
නහාපෙතබ්බා, ස්නානයකරවියයුත්තාහ; කාලෙනකාලං, ක
කලින්කලට; භොජෙතබ්බා, අනුභවකරවියයුත්තාහ, කාලෙ
නකාලං, කලින්කලට; සංවෙසෙතබ්බා, සයනයකරවියයුත්තා
හ—අම්භොපුරිස, පින්වත්වූ පුරුෂය; යදාචඛො, යම්කලෙක්හි
වනාහි; උග්ගතෙජානං, උග්‍රවූ තෙජස්ඇත්තාවූ; ඝොරවිසානං,
දරුණුවිෂඇත්තාවූ; ඉමෙසං චතුන්නං ආසිවිසානං, කාෂ්ඨමු
ඛාදි මේ ආශිවිෂයෝ සතරදෙනාඅතුරෙන්; අඤ්ඤතරොවා,
අඤ්ඤතරෙවා, එක්තරා එක්තරා එකෙක්හෝ; තෙ, තට; කු
පිස්සති, කිපුනේවීනම්; තදා, එකල්හි; අම්භො පුරිස, පින්වත්
පුරුෂය; ත්වං, තෝ; මරණංවා නිගච්ඡස්සති, මරණයට හෝ
පැමිණෙන්නේය; මරණමත්තංවා දුක්ඛං, මරණසමාන දුක්ඛ
ට හෝ පැමිණෙන්නේය; අම්භොපුරිස, පින්වත් පුරුෂය; තෙ,
තාවිසින්; යං, යමක්; කරණීයං, කටයුතුද; තංකරොහීති, ඒ
කරවයි කීයේය—අථඛො, ඉක්බිතෙන්; භික්ඛවෙ, මහණෙ
නි; සො පුරිසො, ඒ පුරුෂතෙම; උග්ගතෙජානං, උග්‍රවූ තෙ
ජස්ඇත්තාවූ; ඝොරවිසානං, දරුණුවිෂඇත්තාවූ; චතුන්නං
ආසිවිසානං, ආශිවිෂයෝ සතරදෙනාට; භීතො, භයගත්තේ;
යෙන වා තෙනවා, යම් ඒදිශාවකට; පලායෙථ, පලායන්
නේය; තමෙනං, ඒ පුරුෂයාට; එවං වදෙය්‍යුං, මෙසේ කිය
න්නාහ; අම්භොපුරිස, පින්වත් පුරුෂය; යත්ථෙව, යම්තැ
නෙක්හිම; නං, ඔහු; පස්සාම, දුටුවෙමුනම්; තත්ථෙව, එතැන්
හිම; නං, ඔහු; ජීවිතා වොරොපෙස්සාමා 'ති, ජීවිතයෙන්
තොරකරම්හයි, පච්චත්ථිකා, ප්‍රත්‍යර්ථිවූ; ඉමෙ පඤ්චවධකා,
මේ වධකයෝ පස්දෙනා; තෙ පිට්ඨිතො පිට්ඨිතො, තා පසුපස්
සෙහි; අනුබද්ධා, අනුව එන්නාහ—අම්භොපුරිස, පින්වත්පුරුෂය;
තෙ, තාවිසින්; යං, යමක්; කරණීයං, කටයුතුද; තංකරොහී'ති,
ඒ මොවුන්ගෙන් මිදීම කරවයි කීයේය—අථඛො, ඉක්බිතෙන්;
භික්ඛවෙ, මහණෙනි; සො පුරිසො, ඒ පුරුෂතෙම—පෙ—චතු
න්නං ආසිවිසානං, ආශිවිෂයෝ සතරදෙනාට; භීතො, භයගත්
තේ; පච්චත්ථිකානං, ප්‍රත්‍යර්ථිවූ; පඤ්චන්නං වධකානං, වධක
යන්පස්දෙනාට; භීතො, භයගත්තේ; යෙනවා තෙනවා, යම්
ඒ තැනකටහෝ; පලායෙථ, පලායන්නේය—තමෙනං, ඒ පුරු
ෂයාට; එවංවදෙය්‍යුං, මෙසේකියන්නාහ; අම්භොපුරිස, එම්බ
ලපුරුෂය; යත්ථෙව, යම්තැනෙක්හිම; නං, ඔහු; පස්සිස්සාමි, දුටු
යේවීනම්; තත්ථෙව, එතැන්හිම; සිරංවාපාතෙස්සාමීති, හිසහෝ

කපාදම්මියී; අනන්තරචරො, වැලිකෙළියෙහිපටන් එක්වවැඩූ
නාවූ; උක්ඛිත්තාසිකො, ඔසවා ගන්නාලද කඩුපත්ඇති; ඡ
ට්ඨො වධකො, සවැනි වධකතෙම; පිට්ඨිතො පිට්ඨිතො, පසු
පස්සෙහි; අනුබද්ධො, ලුහුබඳනා ලද්දේය; අම්භොපුරිස, එ
ම්බල පුරුෂය; තෙ, තාවිසීත්;යං කරණීයං, යමක් කටයුතුද;
තංකරොහීති, ඒ ඔහුගෙන් මිදීමකරවයි කීයේය–අථඛො, ඉක්
ඛිත්තෙන් වනාහි; භික්ඛවෙ, මහණෙනි; සො පුරිසො, ඒ පු
රුෂතෙම—පෙ—චතුන්නං ආසිවිසානං, ආශිවිෂයෝ සතරදෙ
නාට; භීතො, භයගත්තේ; පඤ්චන්නං පච්චත්ථිකානං, ප්‍රත්‍යර්ථීවූ; පඤ්ච
න්නං වධකානං, වධකයන් පස්දෙනාට; භීතො, භයගත්තේ;
ඡට්ඨස්ස, සවැනිවූ; උක්ඛිත්තාසිකස්ස, ඔසවා ගන්නාලද කඩු
පත්ඇති; අනන්තරචරකස්ස, වැලිකෙළියෙහි පටන් එක්ව වැඩූ
නාවූ; වධකස්ස, මිත්‍රවධකයාට; භීතො, භයගත්තේ; යෙනවා
තෙනවා, යම් ඒ තැනකට හෝ; පලායෙථ, පලායන්නේද–
සො පුරිසො, ඒ පුරුෂතෙම; සුඤ්ඤං ගාමං, ජනශූන්‍ය ග්‍රාමයක්;
පස්සෙය්‍ය, දක්නේය;යංයං එව ඝරං පවිසෙය්‍ය, යම්යම් ගෙය
කටම වදනේද; රිත්තකඤ්ඤෙව පවිසෙය්‍ය, සිස්වූ ගෙයකටම
වදනේය; තුච්ඡකඤ්ඤෙව පවිසෙය්‍ය, තුච්ඡවූ ගෙයකටම වද
නේය; සුඤ්ඤකඤ්ඤෙව පවිසෙය්‍ය, ආහාරපානාදියෙන් ශූන්‍ය
වූ ගෙයකටම වදනේය; යඤ්ඤභාජනං පරාමසෙය්‍ය, යම් භා
ජනයක් පිරිමැද්දේවීනම්; රිත්තකඤ්ඤෙව පරිමසෙය්‍ය, සිස්
වූ භාජනයක්ම පිරිමදනේය; තුච්ඡකඤ්ඤෙව පරිමසෙය්‍ය,
තුච්ඡවූ භාජනයක්ම පිරිමදනේය; සුඤ්ඤකඤ්ඤෙව පරිමසෙ
ය්‍ය, ශූන්‍යවූ භාජනයක්ම පිරිමදනේය–තමෙනං, ඒ පුරුෂයාහ
ට; එවං වදෙය්‍යුං, මෙසේ කියන්නාහ; අම්භොපුරිස, එම්බල පු
රුෂය; ඉදානි, දැන්; ඉමං සුඤ්ඤංගාමං, මේ ජනශූන්‍යවූ ග්‍රාමය;
චොරා ගාමඝාතකා, ගම්පහරණ සොරහු; වධිස්සන්ති, නස
න්නාහ; අම්භො පුරිස, එම්බල පුරුෂය; තෙ, තාවිසිත්; යං,
යමක්; කරණීයං, කටයුතුද, තං කරොහීති, ඒ මොවුන්ගෙන්
මිදීම කරවයි කීයේය–අථඛො, ඉක්ඛිත්තෙන්; සො පුරිසො,
ඒ පුරුෂතෙම, උග්ගතෙජානං, උග්‍රතෙජස් ඇති; ඝොරවිසා
නං, දරුණුවිෂඇත්තාවූ; චතුන්නං ආසිවිසානං, ආශිවිෂයෝ
සතරදෙනාට, භීතො, භයගත්තේ; පච්චත්ථිකානං, ප්‍රත්‍යර්ථීවූ;
පඤ්චන්නං වධකානං, වධකයන් පස්දෙනාට; භීතො, භයග
ත්තේ; ඡට්ඨස්ස, සවැනිවූ; උක්ඛිත්තාසිකස්ස, ඔසවා ගන්නා
ලද කඩුපතඇති; අනන්තරචරකස්ස වධකස්ස, වැලිකෙළියෙහි
පටන් එක්ව වැඩූනාවූ මිත්‍රවධකයාට; භීතො, භයගත්තේ;

ගාමඝාතකානං චොරානං, ගම්පහරණ සොරුන්ට; භීතො,
භයගත්තේ; යෙනවා තෙනවා, යම් ඒ තැනකට හෝ; පලායෙ
ථ, දිවත්තේය; සො, ඒ පුරුෂතෙම; මහන්තං උදකණ්ණවං, පු
ලුලින් හා ගැඹුරින් යුක්තවූ මහ ගඞ්ගාවක්; පස්සෙය්‍ය, දක්තේ
ය; ඔරිමංතීරං, ඒ ගඞ්ගාවගේ මෙතෙර; සාසංකං, සප්පාදීන්
ගෙන් සැක කටයුතුය; සප්පටිභයං, එසේහෙයින් ප්‍රතිභයසහි
තය; පාරිමං තීරං, ගඞ්ගාවගේ එතෙර; ඛෙමං, නිර්භය වත්තේ
ය; අප්පටිභයං, එසේහෙයින්ම ප්‍රතිභය රහිතය; අස්සා සන්තා
රණී, ඒ ගඞ්ගාවෙන් එතරවීමට සුදුසුවූ; නාවා, නාවුකාවක්
ද නැත්තේය; අපරාපරං ගමනාය, මෙතරින් එතරවීමටද එතරි
න් මෙතර වීමටද; උත්තරසෙතු වා, වෘක්ෂපදරාදීන් කරණලද
හෙයකුදු නැත්තේය—අථඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහ
ණෙනි, තස්ස පුරිසස්ස, ඒ භයටපැමිණි පුරුෂයාට; එවමස්ස, මෙ
බඳුසිතක් පහළවිය; අයං ඛො උදකණ්ණවො, මේ ගඞ්ගාව ව
නාහි; මහා, පුලුලින්හා ගැඹුරින් මහත්වන්නේය; ඔරිමංච තීරං
මේ ගඞ්ගාවගේ මෙතරද; සාසංකං, සර්පාදීන්ගෙන් සැක කට
යුතුය; සප්පටිභයං, එසේහෙයින් ප්‍රතිභය සහිතය; පාරිමං තීරං,
ගඞ්ගාවගේ එතෙර; ඛෙමං, නිර්භයවන්නේය; අප්පටිභයං, එසේ,
හෙයින් ප්‍රතිභය රහිතය; සන්තාරණී, එතරවීමට සුදුසුවූ; නා
වා නත්ථි, නැවක්ද නැත්තේය; අපරාපරං ගමනාය, ඔබිනොබ
යාම්විමට; උත්තරසෙතු වා, වෘක්ෂපදරාදියෙන් කරණලද හෙ
යකුදු නැත්තේය-අහං, මම; තිණ, තෘණජාතිය; කට්ඨ, ශුෂ්ක
කාෂ්ඨය; සාඛා, ප්‍රසාඛාය; පලාසං, පත්‍රකිශලය යන මේ සිය
ලල; සංකඩ්ඪිත්වා, ඒකස්ථානයකට රැස්කොට; කුල්ලං බන්ධිත්වා,
පසුරක්කොට බැඳ; තං කුල්ලං නිස්සාය, ඒ පසුරනිසා; හත්ථෙ
හි ච, හස්තද්වය කරණකොට ගෙණද; පාදෙහිච, පාදද්වය
කරණකොට ගෙණද; වායමමානො, වීර්‍ය්‍යකරණු ලබන්නේ;
සොත්ථිනා, සැපසේ; පාරංගච්ඡෙය්‍යං, පරතෙරට ගියේවීනම්;
යන්නූනාහං, ඉතා යෙහෙකැයි සිතුයේය—අථඛො, ඉක්බිත්
තෙන්, භික්ඛවෙ, මහණෙනි; සො පුරිසො, ඒ පුරුෂතෙම;
තිණ, තෘණජාතිය; කට්ඨ, ශුෂ්කකාෂ්ඨය; සාඛා, ප්‍රසාඛාය; ප
ලාසං, පත්‍රකිශලය යන මේ සියල්ල; සංකඩ්ඪිත්වා, ඒකස්ථානය
කට රැස්කොට; කුල්ලං බන්ධිත්වා, පසුරක්කොට බැඳ; තං කු
ල්ලං නිස්සාය, ඒ පසුරනිසා; හත්ථෙහිච, හස්තද්වය කරණ
කොට ගෙණද; පාදෙහිච, පාදද්වය කරණකොට ගෙණද;
වායමමානො, වීර්‍ය්‍යකරන්නේ; සොත්ථිනා, සැපසේ; පාරං
ගච්ඡෙය්‍ය, පරතෙරට යන්නේය; තිණ්ණො, ගඞ්ගාවෙන් එත

ර්වූ; පාරගතො, පරතෙරට ගියාවූ; බ්‍රාහ්මණො, බාහිතබනලද අකුශලයන් ඇතිහෙයින් බ්‍රාහ්මණ නම්වූ ක්ෂීණාශ්‍රාවකතෙම; ථලෙ තිට්ඨති, නිර්භය භූමි නමැති ගොඩ සිටිසේකි.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මාවිසින්; අත්ථස්ස විඤ්ඤාපනාය, මේ අර්ථය අවබොධකරණු පිණිස; අයංඛො උපමා, මේ උපමාව වනාහි; කතා, කරණලද්දීය; එත්, මේ උපමාවෙහි; අයංච අත්ථො එව, මේ අර්ථයමැයි—භික්ඛවෙ, මහණෙනි; උග්ගතෙජානං, උග්‍රවූ තෙජස්ඇති; ඝොරවිසානං, දරුණු විෂඇති; චත්තාරො ආසිවිසා'තිඛො, ආශිවිෂයෝ සතරදෙනායයි කියා; පඨවිධාතු, සථබලක්ෂණ පෘථුවිධාතුය; ආපොධාතු, ද්‍රවලක්ෂණ ආපොධාතුවය; තෙජොධාතු, උෂ්ණලක්ෂණවූ තෙජොධාතුවය; වායොධාතු, සමුදීරණලක්ෂණවූ වායොධාතුවය (යන මේ) චතුන්නං මහාභූතානං, සතරමහාභූතයන්ට; එතං අධිවචනං, මේ නමකැයි වදාළසේක—භික්ඛවෙ මහණෙනි; පච්චත්ථිකා පඤ්චවධකා, ප්‍රත්‍යර්ථිවූ වධකයෝ පස්දෙනෙකැයි කියා; පඤ්චන්නං උපාදානක්ඛන්ධානං, උපාදානස්කන්ධයන් පස්දෙනාට; එතං අධිවචනං, මේ නමකැයි වදාළසේක—සෙය්‍යථීදං, ඒ උපාදානස්කන්ධයෝ පස්දෙන නම් කවරේදයත්? රූපූපාදානක්ඛන්ධස්ස, රූපූපාදානස්කන්ධයටද; වෙදනූපාදානක්ඛන්ධස්ස, වෙදනූපාදානස්කන්ධයටද; සඤ්ඤූපාදානක්ඛන්ධස්ස, සඤ්ඤූපාදානස්කන්ධයටද; සඞ්ඛාරූපාදානක්ඛන්ධස්ස, සඞ්ඛාරූපාදානස්කන්ධයටද; විඤ්ඤාණූපාදානක්ඛන්ධස්ස, විඤ්ඤාණූපාදානස්කන්ධයටද; උපාදානක්ඛන්ධං එතං අධිවචනං, මේ පඤ්චස්කන්ධයයි වදාළසේක—භික්ඛවෙ, මහණෙනි; උක්ඛිත්තාසිකො, ඔසවාගත්තාලද කඩුපතඇති; අන්තරචරො, වැලිකෙළියෙහි පටන් එක්ව වැඩුනාවූ; ඡට්ඨො වධකො, සවැනි වධක මිත්‍රයායයි කියා; නන්දිරාගස්ස, ඒ ඒ භවයෙහි ඇල්ම කරන්නාවූ තෘෂ්ණාවට, එතං අධිවචනං, මේ නමකැයි වදාළසේක—භික්ඛවෙ, මහණෙනි; සුඤ්ඤංගාමං 'තිඛො, ශූන්‍යග්‍රාමයයි කියා; අජ්ඣත්තිකානං, අධ්‍යාත්මිකවූ; ඡන්නං ආයතනානං, චක්ඛායතනාදි ෂඩායතනයන්ට; එතං, අධිවචනං, මේ නාමෙකැයි වදාළසේක; භික්ඛවෙ, මහණෙනි; චෙ, ඉදින්; චක්ඛුතොපිච, චක්ෂුද්වාරයෙන්ද; ව්‍යත්තො, ව්‍යක්තවූ; මෙධාවී, සිහිඇති; පණ්ඩිතො, ප්‍රඥාවන්තපුද්ගලතෙම; නං, ඒ රූපය; උපපරික්ඛති, පරීක්ෂා කරන්නේද; තං, ඕහට; රිත්තකඤ්ඤෙව ඛායති, සිස්වම වැටෙහෙන්නේය; තුච්ඡකඤ්ඤෙව ඛායති, තුච්ඡවම වැටහෙ

න්නේය; සුඤ්ඤකඤ්ඤෙව ඛායති, ශුන්‍යවම වැටහෙන්නේය. භික්ඛවෙ, මහණෙනි; චෙ, ඉදින්; සොතතොපි, ශ්‍රොත්‍රද්වාරයෙන්ද; චය තෙතා-පෙ-ඝාණතොපි, ඝ්‍රාණද්වාරයෙන්ද;-පෙ-ජිව්හාතොපි, ජිහ්වාද්වාරයෙන්ද-පෙ-කායතොපි, කායද්වාරයෙන්ද-පෙ-මනතොපි, මනොද්වාරයෙන්ද-පෙ-සුඤ්ඤකඤ්ඤෙව ඛායති, ශුන්‍යවම වැටහෙන්නේය-භික්ඛවෙ, මහණෙනි; චොරා ගාමඝාතකා'ති ඛො, ගම්පහරණ සොරු සදෙනෙකැයි කියා; බාහිරානං, බාහිරවූ; ඡන්නං ආයතනානං, රූපායතනාදීෂඩායතනයන්ට; එතං අධිවචනං, මේ නමෙකැයි වදාළසේක-භික්ඛවෙ, මහණෙනි; මනාපා, මනොඥවූ; චක්ඛු, දෘෂ්ටව්‍යකාමතා සඞ්ඛ්‍යාත රූප තෘෂ්ණාව නිදානකොට ඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාදලක්ෂණවූ චක්ෂුප්‍රසාදයතෙම; මනාපෙසු රූපෙසු, මනාපවූ රූපයෙහි; හඤ්ඤති, සළුශීවන්නේය-මනාපා, මනොඥවූ; සොතං, ශ්‍රොත්‍රද්වාරය කාමසඞ්ඛ්‍යාතශබ්දය තෘෂ්ණාවනිදානකොටඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද ලක්ෂණවූ ශ්‍රොත්‍රප්‍රසාදයතෙම; මනාපෙසු සද්දෙසු, මනොඥවූ ශබ්දයෙහි; හඤ්ඤති, සළුශීවීමෙන් වැදගන්නේය-මනාපා, මනොඥවූ; ඝාණං, ආඝ්‍රාතුකාමසඞ්ඛ්‍යාත ගන්ධතෘෂ්ණාව නිදානකොට ඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද ලක්ෂණවූ ඝ්‍රාණප්‍රසාදයතෙම; මනාපෙසු ගන්ධෙසු; මනොඥවූ සුගන්ධද්‍රව්‍යයෙහි; හඤ්ඤති, සළුශීවීමෙන් වැදගන්නේය-මනාපා, මනොඥවූ; ජිව්හා, රසාස්වාදිවස්තුකාමතාසඞ්ඛ්‍යාත රසතෘෂ්ණාව නිදානකොටඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද ලක්ෂණවූ ජිහ්වාප්‍රසාදයතෙම; මනාපෙසු රසෙසු; මනාපවූ රසයෙහි; හඤ්ඤති, වැදගන්නේය-මනාපා, මනොඥවූ; කායෙ, ස්පෘෂ්ටාතෘෂ්ණාව නිදානකොටඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද ලක්ෂණවූ කායප්‍රසාදයතෙම; මනාපෙසු පොට්ඨබ්බෙසු, මනොඥවූ ප්‍රෂ්ටව්‍යයෙහි; හඤ්ඤති, වැදගන්නේය-මනාපා, මනොඥවූ; මනො, මනොද්වාරයතෙම; මනාපෙසු ධම්මෙසු, මනොඥවූ රූපාදි අරමුණෙහි; හඤ්ඤති, සළුශීවන්නේයයි වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; මහාඋදකණ්ණවොතිඛො, ප්‍රුලුලින් හා ගැඹුරෙන් සිව්සැතක්මකින් යුක්තවූ මහාගඟාවෙකැයි කියා; කාමොඝස්ස, කාමොඝයටද; භවොඝස්ස, භවොඝයටද; දිට්ඨොඝස්ස, දිට්ඨොඝයටද; අවිජ්ජොඝස්ස, අවිද්‍යාවොඝයටදයන; චතුන්නං ඔඝානං, චතුර්විධවූ ඔඝයන්ට; එතං අධිවචනං, මේ නමෙකැයි වදාළසේක-භික්ඛවෙ, මහණෙනි; සාසඞ්කං, සැකසාටයුතුවූ; සප්පටිභයං; ප්‍රතිභය සහිතවූ; ඔරිමංතීරංතිඛො, ගඟාවගේ මෙතෙරයයිකියා; සක්කායස්ස, ස්වකීයවූ කයෙහි පැවැත්තාවූ විංශතිප්‍රභෙදකවූ සක්කායදෘෂ්ටියට; එතං අධිවචනං, මේ නමෙකැයි වදාළසේක-භික්ඛවෙ, මහණෙනි; ඛෙමං, නිර්භයවූ; අප්ප

විභයං, ප්‍රතිභයරහිතවූ; පාරිමංතීරන්තිඛො, ගඟාවගේ එතෙරයයි කියා; නිබ්බාණස්ස, වාණසඞ්ඛ්‍යාතතෘෂ්ණාවෙන් නිෂ්ක්‍රාන්තලක්ෂණවූ නිර්වාණයට; එතං අධිවචනං, මේ නාමෙකැයි වදාළසේක–භික්ඛවෙ, මහණෙනි; කුල්ලන්තිඛො, පාරුවැයි කියා; අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයට, එතං අධිවචනං, මේ නාමෙකැයි වදාළසේක–සෙය්‍යථිදං, ඒ අෂ්ටාඞ්ගික මාර්ගනම් කවරේදයත්? සම්මාදිට්ඨි, මිථ්‍යාදෘෂ්ටියෙන් පහවූ සම්‍යක්දෘෂ්ටියද; සම්මාසංකප්පො, මිථ්‍යාකල්පනාවෙන් පහවූ සම්‍යක්කල්පනාවද; සම්මාවාචා, මිථ්‍යාවචනයෙන් පහවූ සම්‍යක් වචනයද; සම්මාකම්මන්තො, මිථ්‍යාකර්මාන්තයෙන් පහවූ සම්‍යක් කර්මාන්තයද; සම්මාආජීවො, මිථ්‍යාආජීවයෙන් පහවූ සම්‍යක් ආජීවයද; සම්මාවායාමො, මිථ්‍යාව්‍යායාමයෙන් පහවූ සම්‍යක් ව්‍යායාමයද; සම්මාසති, මිථ්‍යාස්මෘතියෙන් පහවූ සම්‍යක් ස්මෘතියද; සම්මාසමාධි, * මිථ්‍යාසමාධියෙන් පහවූ සම්‍යක් සමාධිය යන මේ අෂ්ටාඞ්ගිකමාර්ගයයි වදාළසේක–භික්ඛවෙ, මහණෙනි; හත්ථෙහිච, හස්තවන්දය කරණකොටගෙණද; පාදෙහිච, පාදවන්දය කරණකොටගෙණද; වායාමොතිඛො, ව්‍යායාමයයි කියා; විරියාරම්භස්ස, පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇත්තාහට; එතං අධිවචනං, මේ නාමෙකැයි වදාළසේක–භික්ඛවෙ, මහණෙනි; බ්‍රාහ්මණො, බහාතබනලද කෙලශයන් ඇතිහෙයින් බ්‍රාහ්මණනම්වූ ක්ෂීණාශ්‍රාවකතෙම; තිණ්ණො, චතුරඝයෙන් එතරව, පාරගතො, පරතෙරට පැමිණී; ථලෙ තිට්ඨති බො, නිර්භයවූ භූමිනමැති ගොඩකැයි කියා; අරහතො, සකලකෙලශයන් ප්‍රහීණකළාවූ ක්ෂීණාශ්‍රව රහතුන්වහන්සේට; එතං අධිවචනං, මේ නාමෙකැයි වදාළසේක.

භගවා, භාග්‍යවත්වූ ගුණයෙන් යුක්තවූ සර්වඥයන්වහන්සේ; ඉදං අවොච, මේ ආශීර්විෂොපමසූත්‍රාන්තධර්මදෙශනාව මෙසේ වදාළසේක; අත්තමනා, සන්තොෂභාවයට පැමිණියාවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො භාසිතං, භාග්‍යවත්හුගේ දෙශනාවට; අභිනන්දුන්ති, සන්තොෂ වූවාහුයි.

ආශීර්විෂොපම සූත්‍රපදාර්ථය

නිමි.

---

* සම්මාදිට්ඨියා සම්මාසංකප්පස්ස සම්මාවාචාය සම්මාකම්මන්තස්ස සම්මාආජීවස්ස සම්මාවායාමස්ස සම්මාසතියා සම්මාසමාධිස්ස–සී. පෙළ.

ආශීර්විෂොපම සූත්‍රයේ

# භා ව ස න් න ය.

---

තවද අප බුදුරජානන්වහන්සේ අනවරාග්‍රසංසාරයෙහි විපරිතවර්තීත මාන සත්ත්වවර්ගයාකෙරෙහි සඤ්ජාතමහාකරුණාවෙන් සාරාසඞ්ඛ්‍යෙය කල්පලක්ෂයක් මුළුල්ලෙහි සමත්‍රිංශත්පාරමිධර්මයන් රැස්කොට බොධිවෘක්ෂමූලයෙහි වැඩහිඳ සවාසනා සකලක්ලෙශයන් නසා ලොවුතුරා බුදුව සත්සතිය ගෙවා සහම්පති මහාබ්‍රහ්මයාගේ ආරාධනාවෙන් දම්සක්පවත්වා ක්‍රමයෙන් විනෙයජනයන් නිවන් දක්වා ජෙතවනමහවිහාරයෙහි වැඩවසනසේක් එක්දිනෙක ධර්මසභාමණ්ඩපයෙහි ධර්මාසනාරූඪව වැඩහිඳ උත්ඝටිතඥය විපඤ්චිතඥය ඥෙයපදපරමය යන සියලු විනෙයජනයන්ට නිවන්සැප දෙනපිණිස මහමෙරඋපුරන්නාක්මෙන්ද මහපොළොව උපුල්කරන්නාක්මෙන්ද භික්ෂුභික්ෂුණී උපාසක උපාසිකාය යන ධර්මප්‍රතිග්‍රාහකවූ සිව්වනක්පිරිසට මේ ආසිවිසොපම සූත්‍රධර්ම දෙශනාව ගෙණහැර දක්වා වදාළසේක-හේ කෙසේදයත්-

එක්ප්‍රත්‍යන්තදෙශයෙක්හි රජෙක් ඝොරවූ දරුණුවිෂඇති නයින් සතරදෙනෙකු ඇති කෙළේය. ඒ එසේමය පරසෙනාගක් අවුත් නුවර වටකළකල්හි ඔවුන් මැදට දමා ඔවුන් බිඳුවන නිසාද ඒ සතුරන් අත මිය යාමටවඩා නයින්ලවා දෂ්ටකරවා මිය යාම යෙහෙකැයි සොරුන් දෂ්ටකරවා මරණුනිසාද යන මේ තුන්කාරණයෙන් රජහු නයින් ඇති කෙරෙත්මය*-එසේඇතිකළ නයින් සතරදෙනාසමීපයට රජතෙම සොරකු අල්වා ගමන්කරවූයේය-ඔහුකැඳවා ගෙණ ගිය රාජපුරුෂයා නයින් උන් පෙට්ටිවල යතුරුහැර මේ තොපට උපස්ථානයට එවූපුරුෂයාය මොහු පාවාගණුවයි කීය-ඉන්එක්නයෙක් පෙට්ටියෙන් නික්ම ඒ පුරුෂයාගේ දකුණුපයින් නැගී දකුණතත් වෙළා උරේපිට පෙණය තබා සුසූ ගගා උන්නේය-අනික් නයෙක් වම්පයින් නැගී වමත වෙළා ගෙණ වම්උරපිට පෙණය තබා සුසූ ගගා උන්නේය-නැවත නයෙක් පිටිපස්සෙන් නැගී බෙල්ලවෙළා ගෙණ ඉස්මුදුනේ පෙණය තබා උන්නේය-සතරවෙනි නයිතෙම බඩමැදින් වෙළා පිටිකර පෙණය තබා හොත්තේය-ඒ පුරුෂතෙම පෙරනමන් නයින් නාඳුනන හෙයින් කිසි භයක් චකිතයක් නැතිව සිටියෙන්ම-එකල්හි සත්ත්වකරුණාඇති නුවනැති පුරුෂයෙක් ඔහු එසේ භයනැතුව සිටියා දැක එම්බලපුරුෂය මේ කිමෙක් දැයි විචාළේය-එකල්හි ඒ සොරතෙම කියනුයේ අපට රජ්ජුරුවන්වහන්සේ දීලූ ආභරණයක ඉනුත් මේ අතකඩකනම් ආභරණය උදරෙහි උදරබන්ධනය බෙල්ලෙහි ග්‍රීවාභරණය ඉසේ ඔටුන්නයයි

---

* රාජානොහි ආසිවිසෙ වඩ්ඪාපෙන්තා තථාරූපෙ චොරෙවා එතෙහි දංසාපෙත්වා මාරෙස්සාම, නගරූපරොධකාලෙ පරසෙනායවා ඛිපිස්සාම, පරබලං නිම්මද්දිතුං අසක්කොන්තො සුභොජනං භුඤ්ජිත්වාව සයනං ආරුය්හ එතෙහි අත්තානං දංසාපෙත්වා සත්තූනං වසං අනාගච්ඡන්තා අත්තනො රුචියා මරිස්සාමාති ආසිවිසා ජග්ගාපෙන්ති—යනු අටුවායි.

කිය–එබසට ඒ නුවනැති පුරුෂතෙම කියනුයේ එම්බලපුරුෂය මේ තට සන්තොෂයට කාරණාවූ පලදනාවෙක් නොවෙයි භයට කාරණාවූ උග්‍රවිෂඝොරවූ සර්පයෝ සතරදෙනෙක–ඒ එසේමය–ඔවුන් සතර දෙනා කෙරෙන් එකෙක් දෂ්ටකෙලේවීනම් දඬුයන්ත්‍රයක්සේ ශරීරය අවසඟ කරණහෙයින් කාෂ්ටමුඛනම් සර්පයෙක–එකෙක් දෂ්ටකල කෙණෙහි පෙරගන්කඩෙක වත්කල දියත්තක්සෙයින් ඇඟමස් දිය කොට වගුරුවන හෙයින් පූතිමුඛනම් සර්පයෙක්–එකෙක් දෂ්ටකල කෙණෙහි අළුම්ටක් මෙන් ශරීරය දවා භස්මකරණහෙයින් අග්නිමුඛනම් සර්පයෙක–එකෙක් දෂ්ටකල කෙණෙහි සතකින් කපා හරණාක්මෙන් සන්ධි වෙන් වෙන් කරණහෙයින් ශස්ත්‍රමුඛනම් සර්පයෙකැයි කීහ–ඒ පුරුෂතෙම එසේ වීනම් නයින්ට උපස්ථාන කොට ජීවත්වෙම් කීහ–එබසට ඒ නුවනැති පුරුෂතෙම කියනුයේ එම්බලපුරුෂය මේ නයිසතරදෙනාකෙරෙන් එකකු නැගී සිටින්ට කියයි, එකෙක් සැතපිඹුන්ට කියයි, එකෙක් අනුභවකරන්ට කියයි, එකෙක් ස්නානයකරන්ට කියයි, එසේ නොකලහොත් දෂ්ටකොට මරන්නාහු වෙති. එබැවින් උපස්ථාන කොට ගත නොහැක්ක, ඔවුන්කෙරෙන් ගැලවී යායුතුයයි උපදෙස් දින–එතෙම යෙහෙකැයි කියා දකුණතින් වමතවෙළා ගෙණ උන් සර්පයාගේ භොගාවලිය පිරිමැද සෙමෙන් ගලවා ඔහු උන් පෙට්ටියෙහි බහා යතුරු ලීය, මේ නියායෙන් ඉතිරි තුන්දෙනාත් පෙට්ටි තුණෙහි බහා යතුරු ලා තමාකැඳවා ගෙණ ආ රාජපුරුෂයාගේ කිසිප්‍රමාදයක් දැක දිවන්නට පටන් ගත, එබව දත් රාජපුරුෂයා නොපට උපස්ථානයට එවූ පුරුෂයා සැඟවී දිවන්නේය, තෙපිම අල්ලා ගණුවයි කියා පෙට්ටිවල යතුරු ගලග–ඒ නයිසතර දෙනාද ඔහු පසුපස්සේ ලුහුබැඳ දිවන්නාහ, ඒ ද ඔවුන් කෙරෙහි මහත් භයින් දිවන්නේය–නැවත රාජපුරුෂයා ගොස් රජහට එපවත් කීහ, එවිට රජතෙම යොධභටයන් පස්දෙනෙකු කැඳවා දඟස්දඟස් පඬුරු දෙනුවයි ගිවිස සොරුමරණ ලෙස මෙහෙයූහ–ඔහුද ඒ සොරා නොබෝ කලකින් මරම්හයි පසුපස්සෙහි දිවන්නට පටන් ගත්හ-පළමු කී නුවනැති ගිහෙසි පුරුෂතෙම නැවතත් ඒ සොරා සමීපයට එළඹ කියනුයේ එම්බලපුරුෂය තට අවැඩපිණිස රජ්ජුරුවන් විසින් යොධයන් පස්දෙනෙකු එවනලදහ, ඔවුන් එන්නට පළමුකොට නොපමාව සැඟවී පලා යවයි කීහ-

එතෙම නයිසතරදෙනාට හා යෝධභටයන් පස්දෙනාට ද භය ගෙණ දිවන්ට පටන් ගත්හ–නැවතත් සෙනෙවිරත්තෙම ඒ සොරා හා වැලිකෙලියෙහි පටන් එක්ව වැඩුනු පුරුෂයෙකු කැඳවා ගෙණ ගොස් රජහු දක්වා මෙතෙම සොරහු ගන්ට සමර්ථවන්නේයයි කීහ–රජතෙම ඕහට සෙනෙවිරත් ධුරය දෙනවිලස ගිවිස සොරහු ගන්නට

යෙදීය–එතෙම මේ කඩුවෙන් ඔහුගේ හිසසිඳ අසවල් අසවල් තෙනාට ද
මම් සඞ්ඛසතරකුත් නියමකොට ලුහුබැඳ දිවනුයේ එම්බල මාගේ මිත්‍රවූ
පුරුෂය නයින් සතරදෙනාත් නැවත්තාහ, යෝධභටයෝ පස්දෙනා
ත් නැවත්තාහ, තට එයින් වන භයෙක් නැත, තාගේ අඹුදරුවන්
රක්ෂාකොට යෙහෙන් ජීවත්වෙවයි අඬගඅඬගා දිවන්නට පටන් ගත්ග–
එබව දත් හිතෙසී පුරුෂතෙම සොරුකරා එලඹ එම්බලපුරුෂය තෙල
තාගේ මිත්‍රවූ පුරුෂතෙම ඔසවා ගත් කඩුව තාගේ බෙල්ලෙහි මුත්
වෙනතෙනෙක බා නොතිබම් යි රජහට සඟසිකව බස්බැණ සඞ්ඛසත
රකුත් නියමකොට දිවඑනුයේ, ඔහුගේ නැලවිලිබස් සැබෑ නැත යම්
සේ වැඩියක් වියයීකොට වඩා දිවවයි කීග–ඒ අසා හෙතෙම නයින් ස
තරදෙනාට හා යෝධයන් පස්දෙනාට ද මිත්‍රයෙකුසේ දිවඑන වධක
යාට ද භයගෙණ මංමුළාව වනමඬ්‍යයකින් දිවනුයේ මිනිසුන් ඉගිල ගි
ය ගෙවල් සයක් ඇති ගමකට වන–එහි සුධාකර්මාන්තාදියෙන් අල
ඞ්කෘතවූ ගෙවල් දැක තමා සා විඩාපත් හෙයින් ගෙවලට වැද එහි භාජ
න දැක ඒ පරීක්ෂාකරණුයේ සැන්දක් පමණ ආහාරයක් වත් අතලො
ස්සක් පමණ දියත්තක්වත් නොදැක මේ සිස්ගෙවල ඉදීමෙන් කම්කි
ම් දැයි කියා ගේන් පිටත්ව පලාගොස් ගම්වැද රුකක්මුල ගසෙහි කපා
එබූ එක්පෝරුවකට නැගී ගසට පිටදී උන්නේය–නැවත ඒ හිතෙසී
පුරුෂතෙම ඔහු කරා අවුත් කියනුයේ එම්බලපුරුෂය මෙතෙන නො
සිඳුව ගම්පහරණ සොරු සදෙනෙක් එතියි කීයේය–එබසට සොරපුරු
ෂතෙම ගම්පහරණ සොරු කුමක් කෙරෙද්දැයි විචාළේය–ගම්පහරණ
සොරුනම් රැගෙවල් වට කොට සිට ගිනි අවුලුවන්නාහු වෙති, ඒ භ
යින් සාරවස්තු හැරගෙණ ගෙය හැර මරණභයින් යන්නවුන් අල්වා
වස්තූත් ගෙණ ඔවුනුත් මරන්නාහු වෙති, ධනරහිතව යන්නවුන්
අල්වා බැඳගෙණ කැමැති තෙනකට ගෙණ ගොස් දැසිදස් කොට ගෙ
ණ මෙහෙගන්නාහු වෙති යි කීයේය–එබසට ඒ සොරපුරුෂතෙම මට
ගමක් ගෙයක් නැතිකල ගම්පහරණ සොරුකුමක් කෙරෙද්දැයි විචා
ළේය. එබසට හිතෙසී පූරුෂතෙම කියනුයේ ගම්නැති මගීජනයන්
අල්වාගෙණ සියයක් දහසක් ගෙණවයි කියති, ඒ දුනහොත් හරිති,
නුදුනහොත් මරති කීග–එසේවීනම් මා සැතපි ඉන්නට සුදුසුතෙනෙ
ක් නොවෙයි සිතා නයිසතරදෙනාට හා යෝධභටයන් පස්දෙනාට
ද මිත්‍රවධකයාට හා ගම්පහරණ සොරුන් සදෙනාට ද භයපත්ව
දිවනුයේ ගංතෙරකට පැමිණියේය. ඒ ගඟ සතර ගව්වක් පලලය, ස
තරගව්වක් ගැඹුරය, ගංවතුරුසතරක් එක්වූතැනෙක එගොඩයන්ට
හෙයක්හෝ ඔරුවක්හෝ නැත්තේය, මෙගොඩ සියල්ලෙන්ම උපද්‍රවය
එගොඩ සියල්ලෙන්ම නිරුපද්‍රවූ අභය පුරය වන්නේය–ඔහු අතද නැ
වක් තනාගන්ට සුදුසු වැ පොරෝ ආදිවූ කිසිඋපකරණයකුත් නැත්

තේය එනතුදුවුවත් අත්පාකොර පිළිනොවන්නෙන් දිරාගිය අතුකොලතණාදිය කඩා රැස්කොට පසුරක්සේ ගොඩගැසීය, එහි තමා ගිලුත් විසිර යනුදක වැල්ගෙණ වෙළා එහි හිඳ රිටිපලුපත් නැතොත් අතින් පයින් පැද ගව්වක් පමණතැන් පසුකෙළේය, එහි කුඩාදිවයිනක්මෙන් කුඩාසැතැක්මෙක් විය. එහි සිට මදක් සැනපී සිටිනාතෙක් ආපස්ස බලනුයේ නයිසතරදෙනා හා යෝධයන් පස්දෙනා හා මිත්‍රවධකයා ද සොරුන්සදෙනා දුටුයේය. ඉදිරිබලනුයේ තුන්ගව්වකින් පැමිණී යා යුතුවූ අභයපුරය දුටුයේය, ඒ දැක පමාවෙන්ට සුදුසු තෙනෙක් නොවෙයි සිතා නැවත වීය්‍ය්‍යවඩනුයේ දෙගව්වක් පසුකෙළේය, එයින් එකසැතැක්මෙක-එතෙනසිට පස්සබලනුයේ දෙගව්වක් පසුවූ සතුරන් දැක භියනැතිව ඉදිරිබලනුයේ දෙගව්වකින් ආසන්නවූ අභයපුරය දැක සන්තොෂව නැවතත් පමානොවනුයේ තුන්ගව්වක් පසුකෙළේය, තුන්ගව්වක් පසුවූ සතුරන් දැක සතුරුවියවුල් පසුවිය, අභයපුරය ඉතා ආසන්නවියයි මහත්සන්තොෂව නැවතත් වීය්‍ය්‍යකරණුයේ සිටිගව්වත් පසුකොට එතෙරගොස් නැගී පසුර පයින් යටිගගට දමා එගොඩ ගොස් බ්‍රාහ්මණවංශඇතිව අභයපුරයෙහි අභිසෙක ලදුයේය.

නයි සතරදෙන වනාහි අපි සතරදෙනෙක් එකසොරෙකු ලුහුබැඳ අල්වා ගත නුහුණුම්හයි ක්‍රොධයෙන් වියළී එහිම මළහ-යෝධයෝ පස්දෙන දහස්දහස් වයනුවෙන් පිරිහුණුම්හයි සෝකයෙන් වියළී එහිම මළහ. මිත්‍රවධකතෙම සෙනෙවිරත් තනතුරු නොලත් සෝකයෙන් වියළී එහිම මළහ-ගම්පහරණසොරු සදෙනද අපි සදෙනෙක් එකසොරෙකු අල්වා ගත නුහුණුම්හයි මානයෙන් වියළී එහිම මළාහයි බුදුහු මෙසේ වදරා එම්බාමහණෙනි තොප සියල්ලවුන් නිවන් දක්වනු සඳහා මා විසින් දැක්වූ මේ එකළපමායෙක එහි අත්‍ථමෙසේ දතයුතු.

ප්‍රත්‍යන්තදෙශයෙහි රාජ්‍යකරණ රජකැයි කියේනම් පෙරජාතියෙහි සත්‍වයාවිසින් කරණලද කම්මය දක්වනලදහ. ඒ රජුට අසුවූ සොරා යයි කියේනම් අනවරාග්‍රසංසාරයෙහි කම්මවෙගයෙන් ඇවිදිනා සත්‍වතෙම දක්වනලද්දේය. ඔහු ගෙණවිත් නයින්ට පාවාදුන් තැනයයි කියේනම් ඒ සත්‍වයා මේ මනුෂ්‍යලෝකයෙහි පිළිසුන්තැන් දක්වනලදහ-ඇඟවෙලා ගත්නයින් සතරදෙනායයි කියේනම් පඨවිධාතුය, ආපොධාතුය, තෙජොධාතුය, වායොධාතුය, යන සතරමහාභූතයන් දක්වනලදහ-එහි පඨවිධාතුනම් මේ ශරීරයෙහි දැඩිගුණය වන්නේය. ආපොධාතුවනම් මේ ශරීරය වියළී යා නොදී බැඳසිටිනාවු තෙත්ගුණය වන්නේය-තෙජොධාතුවනම් මේ ශරීරය කුණුව යා නොදී කාපුදෙය පැසවන උෂ්ණගුණය වන්නේය-වායොධාතුවනම් මේ ශරීරය වැටී යා නොදී දරණ යාම්එම් පවත්වන භ්‍රමණ ලක්‍ෂණය වන්නේය-මේ ශරීර

ස වියළා සුණුකළහොත් සතර ලාස්සක් පමණ සුණුවන්නේය, ඒ පඨවිධාතුව එකතැනෙක ගොඩක්සේ නොදිරා තිබුයේවීනම් එහි ලොභකරණකෙණෙක් නැත. මේ වූකලී අතකරවෙළා ආභරණ ආකාර දක්වා සොරා මුළාකරවූ නයින්මෙන් හස්තය පාදය කර්ණය නාසය ඇසය කටය බඩය පිටය යන පරිද්දෙන් දික්ව ලුහුඹුව වටව දළව සිහින්ව නොයෙක් ආකාරයෙන් සිට ස්ත්‍රීයෙක පුරුෂයෙක හස්තියෙක අශ්වයෙක යනාදී නොයෙක් ආකාරදක්වා සත්වයන් මුළා කරවන්නේය–ඒ පඨවිධාතුව තමන් එක්කොට බඳිනා ආපොධාතු යයි යන මෙතෙක් ගුණයෙන් යුක්ත නුවූයේනම් මෙසේවූ මුළා නොකරන්නේය, මේ වූ කලී දෙලාස්සක් පමණ ආපොධාතුවෙන් පඨවිධාතුව බැඳී පිරිණුවත් කොට සත්වයන්ගේ ලොභය වඩා මුළාකරවන්නේය–ඒ පඨවිධාතුව හස්තපාදදී රඟින් සිටියෝතිනුත් ආපොධාතුව වියළී යා නොදී බැඳ පිරිණුවත්කොට සිටියත් තෙජොධාතුව නැත්නම් කුණුව දුර්ගන්ධ වගණය වනහෙයින් සත්වයෝ මේ ශරීරය මමය මාගේ යයි සිතා මුළා නොවන්නේය–මේ වූකලී උෂ්ණලක්ෂණවූ තෙජොධාතුවෙන් මේ ශරීරය උණුකොට කුණුව යා නොදී නොයෙක් පැහැය උපදවා මොහු කළුඑකෙක, මොහු එලලූඑකෙක, මොහු තැඹිලිවන් එකෙක, මොහුගේ ඇස ඉතානිලය, ඉසකෙස් ඉතාකළුය, අතුල් පතුල් අධර ඉතා රතුය, නිය ඉතාසුදුය, යන මේ නොයෙක් ආකාර දක්වා සත්වයන් ලොභ කරවන්නේය–එයින් පඨවිධාතුව හස්තපාදදී අවයවලෙසින් සිටියත් ආපොධාතුවෙන් පිරුණුවත් කොට සිටියත් තෙජොධාතුවෙන් කුණුව යා නොදී වර්ණවත්කළත් වායොධාතුව නැත්තේ වීනම් කරණ කථාවක්වත් බලන බැල්මක්වත් ඉඳීමක් සිටීමක්වත් යනෙන ගමනක්වත් නැතිහෙයින් එහි ලොභඋපදවනකෙණෙක් නැත, මේ වූකලී උඩ්ඩගමාවාතය, අධොගමාවාතය, කුච්ඡිසයාවාතය, කොඨසයාවාතය, අඞ්ගමඞ්ගාණුසාරිනො වාතය, අස්සාසපස්සාස වාතයයි කියා සපරිද්දකින් වන්නේය–එහි උඩ්ඩගමාවාතයනම් රැව්දීම් ආදිය පවත්වා උඩට නැගෙණ වාතය, අධොගමාවාතය යන්නෙහි මලමූත්‍රපිටත් කරවන යටට බස්නා වාතය, කුච්ඡිසයාවාතයනම් බඩවැලින් පිටත ඇතුළු කුස හැසිරෙණවාතය, කොඨසයාවාතයනම් අතුනුනළ දිගෙහි පවත්නා වාතය අඞ්ගමඞ්ගාණුසාරිනොවාතයනම් නහරවැල් සිදුරු අනුසාරයෙන් සියලුඅඞ්ගප්‍රත්‍යඞ්ගයෙහි පතළ ගමනාදියෙහි ක්‍රියාපවත්වනලද වාතය, අස්සාසනම් පිටතට නික්මෙන නාසිකාවාතය, පස්සාසනම් ඇතුළට වදනා නාසිකාවාතය යන සයක් බෙදුනු වායොධාතුවෙන් මේ යන එකෙක, මේ සිටිනා එකෙක, මේ හිඳිනා එකෙක, මේ සයනයකරණ එකෙක, මේ නටන එකෙක, මේ ගයන එකෙක, මේ

ගි කියන එකෙකැයි නොයෙක් ආකාරයන් දක්වා බාලජනයන් වලාකරවා ඒ නිසා උපන් ලොභවෙෂමොහයෙන් දශඅකුසල් සිඞකරවා සතරඅපායෙහි දුක්දෙන්නාහු නම්වෙයි, එබැවින් මේ සතරමහා භූතයෝනම් සත්වයන්ට වැඩසිඞකරණ ඉෂ්ටවූ අයෙක්නොවෙයි, අක්මුල් නැති සසරින් ඉක්ම යා නොදී දුක්දෙනඅයෙක–එයින් පඨවිධාතුව නම් දෂ්ටකළ කෙණෙහි ශරීරය කාෂ්ටරූපයක් මෙන් අවසඟකරණ හෙයින් කාෂ්ටමුඛනම් සර්පයා වැන්නේය, ඒ එසේමය-යම් දවසක මේ ශරීරයෙහි පඨවීධාතුව කිපුනේ වීනම් අතපය වසඟ නොවන්නේය, ඇට දුඞය නමුදු කොරපිළිය නමුදු වන්නේය–ආපොධාතුව දෂ්ටකළ කේණෙහි ශරීරමාංස දියකොට වගුරුවන්නාවූ පූතිමුඛ නම් සර්පයා වැන්නේය, ඒ එසේමය-යම් දවසක මේ ශරීරයෙහි ආපොධාතුව කිපුනේවී නම් එකල්හි අතිශාරය, වමනය, ප්‍රමෙහය, ප්‍රතිශ්‍යාය, යනාදිවූ ව්‍යාධියෙන් මස් දියකොට ඇට පමණක් ඉතිරිකරන්නේය–තෙජොධාතුව නම් දෂ්ටකළ කෙණෙහි ශරීරය භස්මකරණ අග්නිමුඛනම් සර්පයා වැන්නේය, ඒ එසේමය–යම්දවසක මේ ශරීරයෙහි තෙජොධාතුව කිපුනේවී නම් දහය, පිපාසය, උන්මාදය, පිත්තරොගය, ක්ෂයරොගය, යනාදී රොගඋපදවා ශරීරය ක්ෂය කරන්නේය–වායොධාතුවනම් දෂ්ටකළ කෙණෙහි සන්ධිසිඳීමෙන් වෙන් කරන්නාවූ ශස්ත්‍රමුඛනම් සර්පයා වැන්නේය, ඒ එසේමය· යම් දවසක මේ ශරීරයෙහි වායොධාතුව කිපුනේවී නම් මලමූත්‍රය බන්ධනකොට පියයී, ඇඟඉසරුජා උපදවයි, ශරීරය උදුම්වා අවසඟකෙරෙයි, එබැවින් මේ සතර මහාභූතයෝ නයින් සතර දෙනෙකු වැන්නේය–එයින් එක්නයෙක් නැඟිසිටිම් කී කල්හි අනිකා සැතපෙමියි කියන හෙයින් අනිකා අනුභවකෙරෙමියි කියන හෙයින් අනිකා දිය නාමියි කියන හෙයින් එකක්හු විසින් උපස්ථාන කොට සිත්ගත නොහැක්කේය–එමෙන් මේ ශරීරයෙහි පඨවිධාතුවට පිළියම් කළහොත් ආපොධාතුවත් කිපෙයි, තෙජොධාතුවත් කිපෙයි, වායොධාතුවත් කිපෙයි, ආපොධාතුවට පිළියම්කළ කල්හි අනිත් සිටි තුන් ධාතුහුම කිපෙති, අනිකුත් ධාතූන්ටත් මෙමරඟය, එබැවින් සත්වයන්ට කාසශ්වාසජ්වරඅතීශාරහික්කාප්‍රමෙහාදී නොයෙක් ව්‍යාධි හටගන්නේයි–එබැවින් මේ සතර මහාභූතයෝ වෙනවෙනම නයින් සතර දෙනෙකු වැන්නේය–තවද අටආකාරයකින් සාමාන්‍යයෙන් නයින් සතරදෙනෙකු වැන්නේය, ඒ එසේමය–සර්පයෝ වාසයකරණකල තුඹසෙක හෝ රුක්සිදුරෙක හෝ තණකැලයක හෝ කසලගොඩක හෝ වෙසෙති, මේ සතර මහාභූතයෝද එසේම කෙස් ලොම් නිය දත් සම් මස් නහර ආදිවූ දෙතිස්කුණප කොඨාසයෙහි පවතිති, ඒහිදු කොසයෙහි දුඞිගුණයෙක් පඨවිධාතුව බැදෙන ගුණයෙක් ආපොධාතුව

මුනුතුරුවන ගුණයෙක, තෙජොධාතුව ගැම්මෙන ගුණයෙක, වායොධාතුව භ්‍රමණය කරණ ගුණයෙක, තිබූ එක්තිස්කොටස්හිත් මෙම රහය, මෙසේ වාසස්ථාන හෙයිනුත් මේ සතරමහාභූතයෝ නයින් සතරදෙනෙකු වැන්නෝය.

විෂවෙගාකාර හෙයිනුත් දෂ්ටවිෂය දිෂ්ටිවිෂය පුෂ්ටවිෂය වාතවිෂයයි කියා සතර ආකාරයක් ඇත්තාහ-එහි දෂ්ටකළ කල්හි විෂනැගෙන්නාවූ සර්පයෝ දෂ්ටවිෂනම් වෙති, ඇසින් දුටුකල්හි විෂනැගෙන්නාවූ සර්පයෝ දිෂ්ටිවිෂනම් වෙති, ඇග වැදගත්කල්හි විෂනැගෙන්නාවූ සර්පයෝ පුෂ්ටවිෂනම් වෙති, නයා ඇඟවැදගත් සුලං මිනිසා ඇඟවැදගත්කල්හි විෂනැගේනම් ඔහු වාතවිෂනම් වෙති, එසේම මේ සතරමහාභූතයෝද කර්මජය චිත්තජය ඍතුජය ආහාරජයයි කියා සතර ආකාරයෙක් ඇත්තාහ.

එහි පෙර ජාතියෙහි කළ කර්මයෙන් උපදවන භූතයෝ කර්මජනම් වෙති, චිත්තයෙන් උපදවන භූතයෝ චිත්තජනම් වෙති, ශීතොෂ්ණයෙන් උපදවන භූතයෝ ඍතුජනම් වෙති, අනුභව කළ ආහාරයෙන් උපදවන භූතයෝ ආහාරජනම් වෙති, මෙසේ ආකාර හෙයිනුත් සතරමහාභූතයෝ නයින් සතරදෙනෙකු වැන්නාහ–නැවත අපවිත්‍රයෙහි තැවරුණු සර්පයින් අල්වන්නාවූ පුරුෂයාගේ ශරීරයත් අපවිත්‍ර වෙයි දුර්ගන්ධවෙයි, විෂ නැගෙයි ව්‍යාධි පැමිණෙයි මරණ පැමිණෙයි කියා අනර්ථ පසෙක් වෙයි–එසේම මේ සතරමහාභූතයන් ඇත්තාවූ සත්වයාගේ ශරීරයද කෙලසොටු මලමූත්‍රාදී භූතයන් නිසා අපවිත්‍ර වෙයි කුණුව පූයායෙන් දුර්ගන්ධ වන්නේය, සෙවතකුෂ්ට තාම්‍රකුෂ්ටාදියෙන් ව්‍යාධි හටගන්නේය, ඔහුගේ මිහිකිරීමෙන් ජරානම් වන්නේය, ඔහුගේ බිඳීම මරණනම් වන්නේ යයි කියා පස් අනර්ථයක් කාරණහෙයින්ද සතරමහාභූතයෝ නයින් වැන්නෝය–නැවත උපස්ථාන නොකොට හැකිහෙයින්ද නයින් වැන්නෝය, ඒ එසේමය, නයින් සතරදෙනාට එකක්හු විසින් උපස්ථාන කොට කිපිය නොදී සිත් ගතනොහැක්කෝද එමෙන් මේ සතරමහාභූතයන්ටද වෙනවෙනම එකක් එකක්හට පිළියම් කොට කිපිය නොදී නොනැවැත්විය හැක්කෝය—තවද සර්පයෝ තමන් විෂසාරහෙයින් හා තමන් ලොවට අනර්ථකරණහෙයින් ලංවිය නොහැක්කෝද එසේම මේ සතරමහාභූතයෝද යමක්හුගේ ශරීරයෙහි කුෂ්ටආකාරයෙන් ව්‍රණආකාරයෙන් පූයාආකාරයෙන් සිටි සත්වයාට ලංවිය නොහැකිහෙයින්ද නයින් වැන්නෝය–අවිශෙෂකාරීහෙයින්ද සර්පයන් වැන්නෝය—සර්පයෝද මුන් සිල්වතැයි කියාද මුන් දුස්සීලයයි කියාද මුන් නුවනැත්තනැයි කියාද මුන් නුවනනැත්තනැයි කියාද

මුන් රුවඇත්තනැයි කියාද මුන් රුවනැත්තනැයි කියාද මුන් වංශඇත්තනැයි කියාද මුන් වංශනැත්තනැයි කියාද නොතකා කිපි කෙණෙහි සත්ත්වයන් දෂ්ටකොට මරන්නාහු වෙති, එසේම මේ සතරමහාභූතයෝද තමන් කිපි කෙණෙහි නොබලා අනර්ථකරන්නාහු නම් වෙති—ඉදින් මොහු ගුණවිශෙෂ පුරුෂවිශෙෂයක් දනිත්නම් ලොවුතුරා බුදුන්ට අතීසාරාදියෙන් දුක් නොකරන්නාහු නම් වෙති, දෙවදත්තසඞ්ඝරක්ෂිතාදී දුර්ජනයන් එක දවසකුත් නොසිටුවා මරන්නාහු නම් වෙති, එසේ අවිශෙෂකාරීහෙයින්ද මේ සතරමහාභූතයෝ සජීයන් වැන්නාහ—කෙතෙක් දවස් කිරිපොවා මස්කවා රන්පෙට්ටියක ලා රක්ෂාකළත් කෙළෙහි ගුණ නොතකා කිපි කෙණෙහි දෂ්ටකොට මරන්නාහුනම් වෙති,එසේම මේ සතරමහාභූතයෝද උපන්තැන් පටන් කවා පොවා අඳවා පළඳවා කෙතෙක්කල් පොෂ්‍යය කළත් එකදවසක් කන ආහාර අඩුවුව බොන පැන් අඩුවුව ඉඳීම් සිටීම් අඩුවුව එවිටම කිපි අනර්ථකරන්නෝය–එබැවින් අනුපකාරීහෙයින්ද මේ සතරමහාභූතයෝ නයින් සතරදෙනෙකු වැන්නෝය–නැවත නයින් අල්වන්නාවූ පුරුෂයාට කුෂ්ටකිලාසය කොරය පිලූය අන්ධය බධිරය යනාදීන් නොයෙක් උපද්‍රව පැමිණෙන්නෝය, එසේම මේ සතරමහාභූතයන් නිසා සත්ත්වයන්ට අන්ධ බධිර කුෂ්ට කිලාස කොර පිලූ ආදී නොයෙක් උපද්‍රව පැමිණෙන්නෝය–එබැවින් මේ සතරමහාභූතයෝද නයින් සතරදෙනෙකු වැන්නෝය–එබැවින් මේ සතරමහාභූතිකමයවූ මේ ශරීරයෙහි ආලය නොකට යුත්තේය—මේ සජීයෝ නට ආභරණයක් නොවෙයි විනාසකරවූ නයින් සතරදෙනෙකැයි කී හිතෙසී පුරුෂයා නම් සමතිස්පෙරුම් පුරා බුදුව ලොවට ධර්මදෙශනාකරන්නාවූ ලොවුතුරා බුදුහුමය—මේ සතරමහාභූතයන් කෙරෙහි ආලය ඇරගත නුහුනු සත්ත්වයාට සසරදුක්වන නියාවත් එහි ආලය හැරිය සත්ත්වයාට දුක් නොවන නියාවත් දක්වන්නට බුදුහු මෙසේවූ උපමාවක් දක්වන ලද්දේය.

ඒ කෙසේදයත්?—එක්පුරුෂයෙක් නවයෞවනශ්‍රීසාරවූ පඤ්චකල්‍යාණයෙන් යුක්තවූ එක් ස්ත්‍රියක් දෙමවුපියන්ට බොහෝ පඩුරුදී විවාහකොට ගෙණාය, ඒ ස්ත්‍රීතොම ඒ පුරුෂයා නොකැමැති වන්නීය, පරපුරුෂයන් කැමැති වන්නීය, ඒ තෙම තමා කරණ උපස්ථාන අඩුවෙන් මේ මා නොකැමැති වන්නීයයි සිතා කනක කටක තාඩංකාදී නොයෙක් ආභරණ කරවා දින,කසීසලු ආදී නොයෙක් අනර්ඝවස්ත්‍රද ගෙණවුත් දින, ඕතොමෝ අලඞ්කාර බෝවත් පරපුරුෂයන් කෙරෙහි ලොභයම කෙරෙයි, ඒ පුරුෂයාහට ඒ ස්ත්‍රියගේ සිත් දෙරට යනවාත් දුක් වන්නේය අන්පුරුෂයන් දෙස බැලීමත් දුක් වන්නේය කථාකිරීමත් දුක් වන්නේය අතින් පයින් කරණ විකාරත් දුක් වන්නේය ඒ

දැක ඒ පුරුෂතෙම් ඒ ඒ පුරුෂයන් හා අඹ ඩබර විවාදත් කරන්නේය-
මෙසේ කල්යාමක් ගියකල ඒ තෙමේ මෙබඳු කල්පනාවක් කෙළේය,
මෝනොමෝ මාගේ ප්‍රියභාර්‍ය්‍යාවක් නොවෙයි මට සතුරන් බෝකරණ
සැතිරියෙක් නම් වන්නීය, මෝ ඇරිය යුත්තීයයි සබයට කැඳවා ගණ
ගොස් නිරවුල් කොට හළයේය-ඕතොමෝ නාටකස්ත්‍රීන් හා එක්ව නැ
ටුම් ඉගෙණ එක්දවසෙක බොහෝදෙනා මධ්‍යයෙහි නටන්ට පටන්
ගත්තීය, පළමු ගෙයි හිමි පුරුෂයාද ඒ සබයට පැමිණ නැටුම් බලා සිටි
යේය, ඕතොමෝ නටන්නී නොයෙක් පුරුෂයන් දිසාවට වෙන වෙ
න්ම ඇසින් නරැලයි කථාකෙරෙයි සිනාසෙයි අතපය දික්කෙරෙයි
ළඟට යෙයි ඒ දැක ඒ පුරුෂයාට පළමුවෙන් සිතෙහි උපන් වෛෂ්‍යක්
වත් ඔවුනොවුන් හා එක්ව අඹ ඩබරක්වත් නූවූයේය—ඒ කවරහෙය
කින්දයත්? පළමුවෙන්ම ඒ ස්ත්‍රිය කෙරෙහි ලොභය හැරිය නිසාය—
එසේහෙයින් මේ සතරමහාභූතිකාමයවූ මේ ශරීරයෙහි ලොභය හැරිය
කෙණෙකුන්ට සසරදුක් නොවන්නේය-රජහුගේ නියොගයෙන් දහස්
දහස් පඩුරු ගිවිස සොරා පස්සෙහි දිව් යොධභටයෝ පස්දෙනනම් පෙර
ජාතියෙහි කර්‍මශක්තියෙන් මෙතන සත්‍වයන්ට පැමිණි රූපූපාදාන
ක්ඛන්ධය, වේදනූපාදානක්ඛන්ධය, සඤ්ඤූපාදානක්ඛන්ධය, සඞ්ඛාරූපාදාන
ක්ඛන්ධය, විඤ්ඤාණූපාදානක්ඛන්ධය, යන මේ ස්කන්ධයෝ පස්දෙනය—
එහි රූපූපාදානක්ඛන්ධය නම් පඨවිධාතුය, ආපොධාතුය, තෙජොධාතුය,
වායොධාතුය, යන මේ සතරමහාභූතයන් හා චක්ෂුප්‍රසාදය ඒ ඇසට
පෙණෙන්නාවූ වර්ණය ශ්‍රොත්‍රප්‍රසාදය ඒ කණට ඇසෙන්නාවූ
ශබ්දය ඝ්‍රාණප්‍රසාදය ඒ නාසයට දැනෙන්නාවූ සුගඳ දුගඳය, ජිහ්වා
ප්‍රසාදය ඒ දිවට දැනෙන්නාවූ රසය, කායප්‍රසාදය ඒ කයට දැනෙන්
නාවූ ස්පර්ශය, හෘදයවස්තුය අනුභවකළ ආහාරය නිසා පවත්නා රසය
ඔජවය මොවුන් රක්ෂාකරන්නාවූ ජීවිතෙන්ද්‍රියය, ස්ත්‍රීභාවය පුරුෂ
භාවය යන මේ සියල්ල රූපූපාදානස්කන්ධනම් වෙයි—සුඛවෙදනාවය,
දුක්ඛවෙදනාවය, උපෙක්ෂාවෙදනාවය, කුශලවෙදනාවය, අකුශල-
වෙදනාවය, අව්‍යාකෘතවෙදනාවය, යන මේ සදෙරින් අරමුණු රස
විඳිනා වෙදනාව වෙදනූපාදානස්කන්ධනම් වෙයි.

රූපසඤ්ඤාය, ශබ්දසඤ්ඤාය, ගන්ධසඤ්ඤාය, රසසඤ්ඤාය, පොට්ඨබ්බස
ඤ්ඤාය, යන මේ වඩුවන් විසින් දැව්ආදියෙහි කළුහුය ගසා සලකුණු
කිරීමක්මෙන් නැවත නැවත ඇඳින ගැන්ම යයි කියනලද ප්‍රත්‍යයා
භිඥාන ලක්ෂණවූ සංඥාවතොමෝ සඤ්ඤූපාදානස්කන්ධනම් වෙයි.

+ ස්පර්ශය (වෙදනාය) චෙතනාවය එකාග්‍රතාවය ජීවිතෙන්ද්‍රියය මන

---

+ මෙහි පටිපාටිය ආකුලයි,

ස්කාරය විතක්කය විචාරය අධිමොක්ඛය ප්‍රීතිය පස්සද්ධිය ශ්‍රද්ධාය හිරිය ඔත්තප්පය අලොභය අද්වෙෂය අමොහය තත්‍රමජ්ඣත්තතාය කායපස්සද්ධිය චිත්තපස්සද්ධිය කායලහුතාය චිත්තලහුතාය කායමුදුතාය චිත්තමුදුතාය කායපාගුඤ්ඤතාය චිත්තපාගුඤ්ඤතාය කායුජ්ජුකතාය චිත්තුජ්ජුකතාය කායකම්මඤ්ඤතාය චිත්තකම්මඤ්ඤතාය සම්මාදිට්ඨිය සම්මාවාචාය සම්මාකම්මන්තාය සම්මාආජීවය සම්මාසංකප්පය සම්මාවායාමය සම්මාසතිය සම්මාසමාධිය ප්‍රඥාය මොහය අහිරිකය අනොත්තප්පය උද්ධච්චය ලොභය දිට්ඨිය මානය ඉස්සාය මච්ඡරියය කුක්කුච්චය ථීනය මිද්ධය විචිකිච්ඡාය යන මේ දෙපණසක් * චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නම් වෙයි.

කාමාවචරය රූපාවචරය අරූපාවචරයයි තුන්ලොවකින් වෙනස්වූ කුශලාකුශලය අව්‍යාකෘතයයි ජාතිතුණක් ඇත්තාවූ චිත්තය විඤ්ඤාණූපාදනක්ඛන්ධ නම් වෙයි.

මේ පඤ්චස්කන්ධයෝ කවරහෙයකින් වධකයෝ නම් වෙද්දයත්?— මේ පඤ්චස්කන්ධයන් ඇතිතෙක් සත්වයාට වධ පැමිණෙනහෙයින්ද මොවුන් පස්දෙනා ඔවුනොවුන් නසා ගෙණ (තමනුත්) නැසෙන හෙයින් වධකයෝනම් වෙති–ඒ එසේමය යම්සේ සත්වයන්ට රාජචොරසිංහව්‍යාඝ්‍රාදීන්ගෙන්ද කාසශ්වාසාතීසාරාදි ව්‍යාධියෙන්ද යම් වධයක් පැමිණෙන්නේ වීනම් ඒ පඤ්චස්කන්ධය නිසාමය, රූපස්කන්ධය තෙමේ නැසෙන්නේ අනික් සතරස්කන්ධයම නසා ගෙණ වෙයි වෙදනාස්කන්ධාදීහුද එසේමැයි එබැවින් වධකයන් වැන්නේය.

තවද රූපස්කන්ධය පෙණපිඩක් වැන්න, වෙදනාස්කන්ධය දියබුබුලක් වැන්න, සංඥාස්කන්ධය මිරිඟු දියක් වැන්න, සංස්කාරස්කන්ධය කෙහෙල්කඳක් වැන්න, විඥානස්කන්ධය ඉන්ද්‍රජාලාවක් වැන්න, † ඒ එසේමය.

බුදුහු එක්කලෙක ගඞ්ගානම් ගංතෙරට වැඩ ගඟෙහි එන පර්වතකූටයක්සේ මහත් පෙණ පිඩක් දැක මහණෙනි මේ පෙණ පිඩ දුටුවෙහිද මේ මනුෂ්‍යයන්ගේ රූපයත් මේ පෙණපිඩ වැන්නේය, මෙසේවූ මහත් පෙණපිඩෙක් පළමුවම පහළවන්නේ නොවෙයි පළමුවෙන් එක දියබුබුලක් පහළ වන්නේය ඒ කෙසඟක් සිවරත් ඇත මැත

* මෙහි පටිපාටිය අභිධම්මාර්ථ සඞ්ග්‍රහයේ ආ ක්‍රමයට විරුද්ධයි.
'තෙරසඤ්ඤසමානා ච චුද්දසාකුසලා තථා,
සොභනා පඤ්චවීසාති විපඤ්ඤස පවුච්චරෙ.

† ඵෙණපිණ්ඩූපමං රූපං වෙදනා බුබ්බුළූපමා,
මරීචිකූපමා සඤ්ඤා සඞ්ඛාරා කදලූපමා
මායූපමඤ්ච විඤ්ඤාණං දෙසිතාදිච්චබන්ධුනා,

නොගොස් උපන් තැන්හිම නැසෙන්නේය එසේ නොනැසුනේවී නම් අගලක් තැන් ගොස් නැසෙන්නේය දෑගලක්තැන් ගොස් නැසෙන්නේය එසේත් නොනැසුනේවීනම් වියතකදී රියනකදී බඹයකදී ඉස්බකදී ගව්වකදී දෙගව්වකදී යොදුනකදී නැසෙන්නේය, එසේත් නොනැසුනේවීනම් දියබුබුලු එකෙක දෙකෙක දහයෙක විස්සෙක සියයෙක දහසෙක යනාදීන් කැටිව මහත් පර්වතයක්සේ ගොඩක් වන්නේය, ගඟෙහි යන පරඬල් කුණුකසල වැල් මුල් දඹු කොළ තණ ආදීවූ සියල්ලම එහි රැස්වන්නේය වතුරෙන් ගඟට බටු කුරුකුඹුවෝද එහිම ගොඩගැසෙන්නාහු වෙති, දියබරණෝත් එහිම සැඟවී ඉන්නාහු වෙති, මෙසේ යන පෙණපිඩ අතරක නොනැසුනේවීනම් එකාන්තයෙන්ම මුහුදුවෙරළගැසී නැසෙන්නේය—ඒ පෙණපිඩෙහි ඇතුළ සිස්ව තිබෙන හෙයින්ද මිරිකාගතදියමුත් වෙන දක්නා දෙයක් නැතිහෙයින් තුච්ඡවන්නේය, ඒ පෙණ දෑවිගොනැස් ඇඳ පුටු ආදියද තැනිය නොහැකිබැවින්ද අසාරවන්නේය, මේ රූපය මවු කුස පළමුවෙන් පිළිසිඳගන්නා කෙණෙහි ඉතා සූක්ෂමවූ බඩපලාගත් හුණුහපුලුපැටියාගේ බඩරෝමය පහන්හිතෙල ගලා සත්වරෙක ගසා දමූකල ලොම්අග තෙල් බිඳුසේ ඉතා ස්වල්පවන්නේය එ තෙමේත් එකෙණෙහිම නැසෙන්නේය එසේ නොනැසුනේවීනම් පැයකින් දෙපැයකින්ද යමකින් දෙයමකින්ද රැයකින් දෙරැයකින්ද දවසකින් දෙදවසකින්ද මසකින් දෙමසකින්ද නැසෙන්නේය.

එසේත් නොනැසුනේවීනම් කෙස් ලොම් නිය දත් සම් මස් ඇට නහර ඇතීව දසඑකඩ මසකින් බිහිව දෙතිස් කුණප කොට්ඨාසයෙන් පිරී අසූදහසක් ක්‍රිමිකුලන්ගෙන් ගැවසී මැසි මදුරු ආදී බාහිරොපද්‍රවයෙන්ගා වාත පිත්ත ශෙලෂ්මාදිකාරාදි අඛ්‍යානාර රොගොපද්‍රවයෙන් පීඩිතව ජරාවෙන් පැසී මරණ නමැති වෙරළ ගැසී විසිර යන්නේය. මෙහි සැපය සුභය නිත්‍යය ආත්මයයි යනු වස්තුවෙක් නැති හෙයින් සිස්වන්නේය. සාමීජ ඔජෝ ධාතු ජීවිතෙන්ද්‍රියය විඥාණය යන මොවුන්ගේ නැසීමෙන් මත්තෙහි තබා රැක්ක නොහැකිහෙයින්ද අසාරවූ පෙණපිඩක් වැන්නේය.

වේදනාව කෙසේ දිය බුබුලක් වැන්නේදයත් ? යම්සේ දියබුබුල යට දියතලාවෙක උඩින් වැටෙන දියබින්දුයෙක, ඒනිසා උඩනැඟි දියරැළියෙක ඒඇතුළම් අසුවූ වාතයෙකැයි යන මේ සතර කාරණයෙන් නිසා සම්පිඩායක්සේ දියබුබුලක් පෙණෙයි එයද ඇතුළ සිස්හෙයින් තුච්ඡවන්නේය ඒ ගෙණ විතක් සෙප්පුවක් නොකළහැකිහෙයින් අසාරවන්නේය, එමෙන් අරමුණු රස විඳිනා වෙදනාවද අනිෂ්ටවූ චක්ෂුප්‍රසාදයද ඊට ආපාථගතවූ වර්ණයෙක ආලොකයෙක මනස්කාර

යෙකු යන කාරණා සතරක් නිසා සැප දුක් වේදනාව පහළ වන්නේය, ඒ පුරුෂයාත් අනුන්ගේ කොල්ලෙකුවුව ගෑනියත් අනුන්ගේ කෙල්ලෙකුවුව ඔවුන් දෙන්නා නිසා උපන් පුත්‍රයා කෙසේ රාජ කුමාර වන්නේදයත්? ඒත් දාසයෙක්මය, එමෙන් චක්ෂුවත් ස්වභාවයෙන්ම අනිත්‍යවූ කල වර්ණයත් එසේම අනිත්‍යවූ කල ඔවුන් නිසා උපන් සැප දුක් වේදනාව කෙසේ නිත්‍යවන්නේදයත්? ඒත් අනිත්‍ය වන්නේය අසාරවන්නේය.

සංඥාව කෙසේ මිරිඟු ජලයක් වැන්නේදයත්?. උෂ්ණ කාලයෙහි බිම් වියලී ද්විපාද චතුෂ්පාදදීන්ගේ පාදප්‍රහාරයෙන් නැගි වාතවේගයෙන් එළලව රිවි රැසට හසුවූ ධූලි රළ නැඟි නැඟී බිඳෙන ගඟාවක් මෙන් මුවන් ඇසට පෙණෙන්නේ වේද ඒ දිය නොවන දෙය දියයයි යන සිතින් මුවෝ දිවියෝ ගව් ගණනකුත් දිව විඩාවැ වැටෙන්නාහු නම් වෙති– එමෙන්ම නහරින් වෙළී මසින් පිරී සමින් වැසී තිබෙන මේ ඇටසැකිල්ලෙහි මේ ස්ත්‍රියෙක මේ පුරුෂයෙක මේ එලලු එකෙක මේ කලු එකෙක මේ රුව ඇති එකෙක මේ රුව නැති එකෙක යනාදීන් මිථ්‍යා සංඥාවෙන් රාග ද්වෙෂ උපදවා සත්වයෝ අපායභාක් වන්නාහු වෙති. එබැවින් සංඥාව මිරිඟුජලයක් වැන්නේය.

සංස්කාරය කෙසේ කෙහෙල් කඳක් වැන්නේදයත්.? යම් පුරුෂයෙක් දැව ගොනැස් ආදියක් පිණිස වනාන්තරයට ගොස් බලනුයේ ඍජුව වටව දික්ව හිටි කෙහෙල් ගසක් දැක අගින් මුලින් කපා පොතු හරිනේ ක්‍රමයෙන් පොතු හැර ඇතුළෙහි තුබූ ගොප්පත විවරක් දුටුවේ වේද එහි පිට පොත්තේ පැහැයත් ඒ පොත්තේ ගණයත් ඒපොත්තේ පලලත් වෙන වෙන එකක් එකකට නැත්තේය මේ හැම පොතුවල ආකාර වෙන වෙනම වේද එබඳු පොතු රැසෙක් කෙසෙල් කඳ නම් වේද හෙද අසාරනම්වේද අස්ථිරනම් වේද තුච්ඡ වේද එමෙන් සංස්කාරස්කන්ධය ඵස්සපුසන ලක්ෂණය චෙතනාවය ආයූහණ ලක්ෂණය යනාදීන් අසාර අස්ථිරවූ වෙන වෙනම ධර්මරාශියෙක.

විඥානය කෙසේ ඉන්ද්‍රජාලයක් වැන්නේදයත්?—ඉන්ද්‍රජාලය දක්වන්නාවූ පුරුෂතෙම කණුවක් සිටුවා ලනු පසක් බැඳ ඊ රෙදි බැඳ එල්වා ඖෂධයෂ්ටියෙන් ගසා සත්වයන්ගේ ඇස් මොහකළ කල්හි සිටුවූ කණුව රුක් කඳක්සේ පෙණෙයි. ඇඳි ලනු අතුසතරසේ පෙණෙයි. එල්ලූ රෙදි මල් ඵලසේ පෙණෙයි, මෙසේ වෙන වෙන දේ එක ගසක්සේ පෙණෙයි, එමෙන් චක්ෂු විඥානය සෝත විඥානය ඝාණ විඥානය ජිව්හා විඥානය කාය විඥානය සම්පටිච්ඡනය සන්තීරණය වොත්ථපනය තදාරම්මණය යන චිත්ත රාශියකින් වන කාරිය එක සිතකින් වනදෙයක්සේ සිතා ගෙණ යාම් ඒම් ඉඳීම් සිටීම්.

යන එන සියල්ලම එක සිතකින් වෙයි චිත්තයද නොනැසෙයි යන විපරීතග්‍රහණයට පැමිණ සත්වයෝ මුළාවන්නාහු වෙති—පෙර අඹ රුකක් නැති මේ අභ්‍යාසයෙහි දුන් අඹ රුකෙක් කොයින්ද මේ මායම කැයි දැනගත් නුවනැති පුරුෂයෙකු මෙන් චක්ෂුර් විඥානය නම් අරමුණු දක්නා සිතෙක. සම්පටිච්ඡනය නම් අරමුණු පිළිගන්නාසිතෙක, සන්තීරණයනම් අරමුණු විමසන සිතෙක, වොත්ථපන නම් අරමුණු නිශ්චයකරණ සිතෙක, ජවනයනම් අරමුණු ඇලුම් කරණ සිතෙක, චක්ෂුර් විඥානය නැසුනුකල සම්පටිච්ඡනය උපදී. සම්පටිච්ඡන සිත නැසුනුකල සන්තීරණ සිත උපදී. සන්තීරණ සිත නැසුනුකල වොත්ථපන සිත උපදී. වොත්ථපන සිත නැසුනුකල ජවන සිත උපදී. මෙසේ වහාම නැසීම් ඉපදීම් ඇතිහෙයින් එකම සිතක් සේ වැටහෙන හෙයින් අසබාවෙක්මය, එබැවින් අනිත්‍යය දුඃඛය අනාත්මයයි සැලකියයුතු.

මේ පඤ්චස්කන්ධය මමය මාගේයයි යන දෘෂ්ටි විපරීතග්‍රහණයට උපමා පසක් දක්වනු—ඒ අසා ආලය දුරුකටයුතු—ගේ කෙසේදයත්?

එක් ගමෙක ජාත්‍යන්ධ පුරුෂයෙක් ඇත ඒ පුරුෂතෙම එක් දිනෙක සබයකට ගොස් උන්නේය, ඒ සබයේ උන් මනුෂ්‍යයෝ පිළියෙහි ගුණ කියන්නාහු සිහින් මොලොක් සුදු පිළී ඇඟට සුවපහස් දෙන්නේයයි වර්ණනාකළෝය, ඒ ඇසුවාවූ අන්ධ පුරුෂතෙම එක් පුරුෂයෙකුට තමා අතින් මිළදී මාහැඟි සුදු කඩක් ඇරගෙණ එවයි කීහ, ඒ තෙමේ මේ අන්ධයා රවටාලා මිළ ඇරගණිමියි සිතා එක්කම්බිලියක් අඩු මිළයකට ගෙණ දැලි තෙල්ගා මැද සිලුටුකොට සුදු කඩෙකැයි කියා අන්ධයා අතට දින, ඒද අතින් අල්ලා බලා සුදු පිළී සුවපහස් දෙන්නේ යනු සැබෑමැයි සතුටුව පෙරවා ගත්තේය—ඒ සිටි නොබෝ කලකින් ඔහුගේ බන්ධුජනයෝ සම්තීවූ ඇස් වෙදකු කැඳවා ගෙණවුත් වෙදකම් කරණලෙස යෙදූයේය, ඒ වෛද්‍යතෙමේ මොහුගේ ඇස මවු කුසදීම පටලයෙන් වැසුනු පමණක්මුත් නැසුනේ නැතැයි දැන ඊට සුදුසු වමන විරේචන ප්‍රත්‍යඤ්ජනාදි නොයෙක් ඖෂධයන්ගෙන් ඇස පාදලිය එකෙණෙහි ඒ අන්ධ පුරුෂතෙම තමා පෙරවි කම්බිලියහා සෙස්සවුන් පෙරවසිටි සුදු පිළී දැක තමා පෙරවුන් කම්බිලියෙහි පිළිකුල්ව කම්බිලියත් දමා කම්බිලිය ගෙණදුන් පුරුෂයා සතුරෙකුමෙන් සිතීය, මෙසේ ඒ අන්ධයා තමා අන්ධහෙයින් පෙර නොදුන පෙරවි කම්බිලිය ඇස පෑදුනුකෙණෙහි පිළිකුල්ව දුරුකෙළේද එමෙන්ම සසර අනාදිමත් කාලයක් මොහය නිසා නොදුන මමය මාගේයයි ගත් රූපයෙහි විපරීතග්‍රහණය ලොවුතුරා බුදුන්ගේ ධර්ම

දෙශනා නැමති ඖෂධය ඇඳීමෙන් පටලය දුරුකොට නුවනැස පාද ගත් සත්ත්වයන් විසින් මමය මාගේ යයි ගත් රූපයෙහි ආලය හැරිය යුත්තේය.

වෙදනාස්කන්ධය රජ්ජුරුවන්ගේ ගවයාගේ සලකුණු දුටුකෙණෙහි හැර ගිය පුරුෂයාමෙන් ආලය දුරුකටයුත්තේය—හේ කෙසේදයත් ?

එක් පුරුෂයෙක් තමාට ගවයන් නැතිහෙයින් වියකොල බැලයට ගොනෙකු ගෙණවිත් සවස ගාලේ ලා රෑ විටින් විට ගොස් බලන්නේය ඒ වෘෂභතෙම මධ්‍යමරාත්‍රියෙහි ගාල් දොර බිඳගෙණ ගියේය, ඒ පුරුෂතෙම පශ්චිම් රාත්‍රියෙහි ගොනා සොයා ඇවිදිනේ තමාගේ ගවයා හා සමුළුස මගතඇති රජ්ජුරුවන්ගේ ගොනෙකු දැක බැඳගෙණ එනුයේ අහරමග පහන්වූ තැන හන්බලනුයේ රාජලාංඡනය දැක මේ රජ්ජුරුවන්ගේ ගොනාය මොහු මම ඇරගෙණ ගියේනම් රජ්ජුරුවන්ගේ ගොන් සොරා ගත්තේයයි කියා මා අල්ලාගෙණ තලා මරා හිංසාදිය කෙරෙති සිතා වහාම එතැනම හැරගියේය—එබඳු රාත්‍රිය මෙන් වෙදනාස්කන්ධයාගේ අනිත්‍යාදී කිසි අසාරයක් නොදන්නාවූ අබුද්ධොත්පාද කාලයෙහි පැමිණ සිටි සැපවෙදනායෙහි ලොල්ව දුඃඛ වෙදනාවක් පැමිණියේද ඊට ප්‍රතිපක්ෂ සැපවෙදනාවම කැමතිව රූප ශබ්දගන්ධරසාදිවූ ඉෂ්ටාරම්මණ කැමැතිව ඇවිද්දත් දැන් බුද්ධොත්පාද නැමති දිවාභාගයෙහි ධර්මදෙශනා නමැති සූර්ය්‍ය රශ්මියෙන් වෙදනාස්කන්ධයාගේ අනිත්‍යදුඃඛඅනාත්මය නුවනැසින් බලා දුටුතැන්පටන් තමා අසිහි නොවනබව දැන ආලය දුරුකටයුත්තේය.

සංඥාස්කන්ධයෙහි ආලය යකින්නියබව හැඳිනගත් තැන ස්ත්‍රියකෙරෙහි ආලය දුරුකළ පුරුෂයාමෙන් ආලය හැරිය යුත්තේ— ඒ කෙසේදයත් ?.

එක් ගමෙක තරුණ මනුෂ්‍යස්ත්‍රියගේ රූපය මවා ගෙණ ආ යක්ෂණියක් එක් පුරුෂයෙක් තමාට විවාහකළේය ඕතොමෝ ඔහට ප්‍රියව මාසය කරන්නීය ඔහු නිදිගත් කල්හි ඈ අමුසොහොනට ගොස් මිනීමස් කා එන්නීය ඒ පුරුෂතෙම එක් දවසක් නොනිදාම හොත්තේය හොත් යහනින් නැගී යන ස්ත්‍රිය දැක බැහැර අනාචාරයකට යන්නීයයි සිතා පසුපස්සේ යන්නේ අමුසොහොනට ගොස් මිනීමස් කනායකින්නී දැක මේ යක්ෂණියෙකැයි මහත් බය ගෙණ තමා උන් ගමටත් ඉදින් නොවැද අනික් ගමකට පලා ගියේය—එමෙන් ලොවුතුරා බුදුන්ගේ බණ නොඇසූ නොදන්නා අවස්ථාවෙහි ස්ත්‍රීපුරුෂ සංඥායෙහි ලොභවූවත් බණ අසා දත් තැන්පටන් ඒ සංඥාස්කන්ධය යක්ෂණියකමෙන් සිතා ලොභය දුරුකටයුත්තේය.

සංස්කාරස්කන්ධයෙහි ලෝභය කරප් මැඩිල්ලට නයා අසුවුන හැන මසුන් ගැන්මෙහි ලෝභය හළ පුරුෂයාමෙන් ලෝභය දුරු කටයුත්තේය—ශේ කෙසේදයත්?.

ගොයකට කරප් ගසන්ට ගිය මිනිසෙක් තමා හැඳි ගන්පලන් පිලී ගොඩ තිබා කවුපින මාත්‍රාවක් හැඳ ඔයට බැස කරප් ගසන්නේය ඔහුගේ කරප් මැඩිල්ලට නයෙක් හසුවිය ඔහු ගැසුනු සලකුණෙන් මහත් මසෙක් හසුවියයි සන්තුෂ්ටව කරප් කටින් අතහෙළා අල්ලනුයේ පෙණ ගොබම හසුවීය එවිටත් අතට මහත්හෙයින් හා ඉතා දික්හෙයින්ද මහත් මසෙකැයි සිතා සන්තොෂව දියෙන් මදක් උඩගත්තේ සෝවැති තුණ දැක විෂඝෝර සර්පයෙකැයි දැන ඔය හැමතැනම සර්පයින්ගෙන් ගැවසුණේයයි සිතා භය ගෙණ කරප්මැඩිල්ලත් නයාත් දමා ගොඩතිබූ ගන්පලන් වස්ත්‍රයටත් ආලය නොකොට දුරටම දිව ගත—දියතුළ නයා හසුව ගත්තෙනම මහත් මත්ස්‍යයෙකැයි නොදැන ලොභවූවාක්මෙන් අබුධොත්පාදයෙහි ඇස්ආදී ධර්මයන් කෙරෙහි ලොභවූවත් බුධොත්පාද නමැති එළිය දුටුතැන් පටන් නයාවැනි ඒ සංස්කාරයන් නිසා වන උපද්‍රව දැන ආලය දුරුකටයුත්තේය.

විඥානස්කන්ධයෙහි ආලය ගිනි කබලෙහි ආලය හළ කුෂ්ටයෙන් මිදුනු පුරුෂයාමෙන් දුරු කටයුත්තේය—ඒ මෙසේ දතයුතු.

එක් ගමෙක්හි එක්තරා පුරුෂයෙකුට කුෂ්ටයක් ඇතිව ඇඟ වණවී කෘමිකුලන්ගෙන් ආකුලව කඩුවී බොහෝසෙයින් මහත් ගිනි කබලක් ලංකොට ගෙණ විටෙක අතය විටෙකපයය විටෙක බඩය විටෙක පිටය යනාදීන් තවන්නේය. ඒ උෂ්ණ වැදගැන්මෙන් පණුවන් හරණ මද ආස්වාදයක් ඇති පමණමුත් එහි ගිනි කබලෙන් තැවූවායෙන් පණුවෝ ගැඹුරේ කා වදිනවාත් වණේ මහත්වනවාත් පූයා බොහෝ වනවාත් නොදන්නේය. මෙසේ දුක් විඳිනා දුටු ඔහුගේ බන්ධු ජනයෝ වෛද්‍යයෙකු ගෙන්වා පිළියම් කරවූවාහුය, ඔහු ඒ රොගයෙන් මිදී තමාගේ ඉෂ්ටමින් ඇවිදිනේය—එක් දිනෙක එසේම ගිනි කබලක් තිබාගෙණ තැවෙන කුෂ්ටරොගියෙක්හු උන් තෙනකට පැමිණියේය, එතෙන උන් මිනිස්හු පළමු රොගී කාලයෙහි ගිනි කබලින් තැවුනා දන්නාහු ඒ ගිනි කබලෙන් තැවෙන ලෙසට කැඳවූහ, එතෙම ඒ නො කැමැතිවිය එකල්හි ඒ පුරුෂයෝ කියන්නාහු පළමු කැමැතිව තැවෙන්නාවූ නෝ දැන් මේ ගිනි කබලෙහි නො තැවෙන්ට කාරණා කිම්ද? ඒ ගිනි උෂ්ණයට මේ ගිනි උෂ්ණය දැඩිදැයි විචාළේය—එබසට ඒ පුරුෂයා කියනුයේ ඒ ගින්නට මේ ගිනි දැඩිවූයේ නොවෙයි තිනි එක ගුණමය මාගේවූකාලී කුෂ්ට රොගය ඡවිගතව කායප්‍රසාදය නැසී මාංශගතවිය කෘමිකුලන්

ගටනත්හෙයින් කඬුවී බොහෝවිය එබැවින් උෂ්ණ සඟනය කොළම් දූන්වූකලී කායප්‍රසාදය ජීවිගතවිය කඬුවිත් දුරුවිය එබැවින් උෂ්ණ නොකැමැත්තෙම් කිය—කුෂ්ටරොගීහු ඒ කුෂ්ටරොගයෙන් මිදී කාය ප්‍රසාදය ඇතිවූ කෙණෙහි ගිනි නොකැමැතිවූවාක්මෙන් අබුබොත්පාදකාලයෙහි දෘෂ්ටිගතිකයන්ගේ වචනයෙන් ප්‍රඥකල්පනාව නැතිවූ තැන දුඃඛ දැයකාවූ විඥනස්කාන්ධය මමය මාගේයයි සිතුවත් බුබොත්පාදකාලයෙහි සධර්මදේශනාවන් ඇසීමෙන් ප්‍රඥකල්පනාව පහළවූ තැනදීම බොහෝකලක් සසරදුඃඛයටම දැයකාව සිටි විඥනස්කාන්ධය මමය මාගේයයි වරදවා නොසිතා ආලය දුරුකටයුත්තේය.

ඔසවාගත් කඩුව බෙල්ලෙහිමුත් වෙන තෙනෙක බා නොතිබමියි සඟසිකාව දිවූ වැලිකෙළියෙහි පටන් පුරුදුවූ මිත්‍රවධකයා නම් උකුණු මකුණු ආදිවූ කුඩා මහත් සියලු ජාතිය කැමති කරවා වසන පටිසන්ධියෙහි පටන් නොහැර පැවැතා ආත්ම සෙනහය වන්නේය, එබැවින් මේ ආත්මසෙනහය නම් රූප ශබ්දදියෙන් සත්වයන් නලවා නලවා ප්‍රාණඝාත අදත්තාදනාදිවූ නොයෙක් පව් සිඩකරවා අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඔපපාතික යන සතර යොනියද මා උපදවා නොයෙක් දුක් දෙනහෙයින් සතර තැනකට කපා දමමියි ආ මිත්‍රවධකයාහා සමාන වන්නේය, ඒ මිත්‍රද තමා කඩුපතින් සොරුගේ හිස කපා ගෙළන හෙයින් වධකනම් විය, මේ විඤ්ඤාණයද අරමුණට යොමුවූ විත්තයෙහි නුවන කපා ගෙළනහෙයින් වධකයෙක් නම් වන්නේය, එබැවින් මේ තමාගේ ආත්මයයි ආත්මයෙහි පැවති සෙනහය මිත්‍රයෙකුමෙන් තමාකෙරෙහි නොසිටුවා සතුරෙකු මෙන් දුරුකටයුත්තේය.

තවද මෙම තෘෂ්ණාවගේ නපුර හඟවන්නට බුදුහු අලලමංසො පමාවක් දක්වා වදාළසේක—ඒ කෙසේදයත් ? යමෙක් අලුත් මස් වැදූල්ලක් පවිත්‍ර අපවිත්‍රාදි යම් මනාප තැනක තිබුයේවීනම් සේදෙයි නපුරෙයි යන විභාගයක් නැතිව එතෙන එතෙනම අලවාගත්තේය, එමෙන් මේ ආත්ම සෙනහය නම් යම් යම් තැනෙක උපනද එතෙන එතෙන විඳිනාවූ දුඃඛය විපරීතකොට සිනා ඒ ඒ භවයෙහි රුව්කරන්නේය—එබැවින් බුදුන්ගේ ධර්මදෙශනාවෙන්ම භවදුඃඛය දැනගත් සත්පුරුෂයන් විසින් මේ ජාතියෙහි භවසම්පත්තියක් නොපතානිවන්ම පැතිය යුත්තේය.

වනමැද දුටු පාලුගම ගෙවල් සයනම්. චක්ඛායතනය, සොතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය යන ආයතනයෝ සදෙනා පාලු ගම පිටින් විසිතුරු සිතියම් ඇති ගෙවල් සයක් මෙන් බාලජනයන්ට රමණීයව පෙණෙයි, යම්සේ ඒ පුරුෂතෙම ගෙවල් සයටම වැද බලනුයේ තමාගේ සාපිපාස සංහිඳුවා

කන්ට සුදුසු සැන්දක් පමණ ආහාරයක්වත් අතලොස්සක් පමණ දියත්තක්වත් නොලැබ මේ සිස් ගෙවල ඉඳ කම් කිම්දැයි පිටතට නික්ම ගියේද එමෙන් නුවනැති පුරුෂතෙමේද මේ චක්ෂුරාදි සයෙහි නුවණින් බලනුයේ සැපයක්වත් ශුභයක්වත් නිත්‍යයක්වත් තමා අයතිව පවත්නා දෙයක්වත් නොදැකීද එබැවින් මේ සදෙරම සිස් ගෙවල් සයක්මෙන් සිතා ඒ ගෙවල්හි නොහිඳ ගිය පුරුෂයාමෙන් මෙහි ආලය හැරිය යුත්තේය.

තවද මෙම දක්වන්නාව බුදුහු ප්‍රාණීන් සදෙනෙකු උපමාවක් කොට වදාළසේක—ඒ කෙසේදයත්? සර්පයෙක කිඹුලෙක ගුරුළෙක බල්ලෙක කැණහිලෙක වඳුරෙකැයි යන සදෙනෙකු එක්කොට අසවල් තැන ගැටයයි නොදැනෙන පරිද්දෙන් බැඳ හළුවාහු වෙද්ද එයින් නයා තුඹස් ආදී විෂම තැනකටම අදනේය එම තුඹසට වැද දරණලා දරණ මන්තේ හිස තබා හොත් කල්හි සිත එකගවන නිසාය-කිඹුලා ගැඹුරු දිය වලකටම අදනේය බිලයකට වැද මුහුන බිලයෙන් පිටත් කොට උන්කල්හි සිත එකගවන නිසාය—ගුරුළු අහසට අදනේය අහස්කුසට නැගී පියාපත් විදහා ඇවිදිනාකලැ සිත එකගවන නිසාය-බලු ගම් දෙරටම අදනේය උදුන් දෙරගළු පිරා හළුපිට වකගසා හොත්කල්හි සිත එකගවන නිසාය—කැණහිලා අමු සොහොනකට අදනේය ඒ මිනිමස්කා මිනියකම හිස තබා හොත් කල්හි සිත එකගවන නිසාය—වඳුරා මහවනයටම අදනේය වන මැද උස් ගසකට නැගී සතරදිගින් කැමැති දිගකට පැන පියන්න සුදුසු අත්තක උන්කල්හි සිත එකගවන නිසාය—මෙසේ නයා තුඹසට අදී, කිඹුලා ගැඹුරු දියටම අදී, ගුරුළා අහසට අදී, බල්ලා ගම්දෙරට අදී, කැණහිලා අමු සොහොනට අදී, වඳුරා වනාන්තරයට අදී, මෙසේ එකක් එකක්හුගේ ආදීනවයක් එකක් එකක්හට නැතිව වෙන වෙනම දිගට ඇද සැලෙන ප්‍රාණීන් සදෙනා මෙන් තෘෂ්ණා නමැති රැහැණින් බැඳී මොහ නමැති ගැටයෙන් ගැළපී පවත්නාවූ චක්ෂුරාදී ආයතනයන් සදෙනා අතුරෙන් ඇස වර්ණයට අදී, ශ්‍රොත්‍රය ශබ්දයට අදී, ඝ්‍රාණය සුගන්ධයට අදී, දිව රසයට අදී, කය ස්පර්ශයට අදී, චිත්තය ධම්මාරම්මණයට අදී, මෙසේ අනාදිමත් සසර එකෙක ආදීනවයක් නැතිව වෙන වෙනම මේ ෂඩායතනයෝ පවතිති, යම්සේ ප්‍රාණීන් සදෙනා ගැටගැසුනු තැන් දැන ගැටය මුදා කණු සිටුවා එහි බැඳි කල වටකරකැවී විඩාව හික්මීමට පැමිණෙන්නාහු වෙද්ද එමෙන් චක්ෂුරාදි සදෙනා මොහ නමැති ගැටෙන් මුදා තෘෂ්ණා නමැති බාණ ගලවා සිහි නමැති රැහැණලා කායගතාසති නමැති ටැඹෙහි වෙන වෙනම බැඳිකල්හි හික්මෙන්නාහු වෙති, මෙසේ ඉඳුරන් හික්මවා ෂඩායතනයෙහි ආසාව දුරුකටයුතු.

හිතෙසී පුරුෂයා එනී කී සොරු සදෙනානම් කවරහුදයත් ? රූපායතනය, ශබ්දායතනය, ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය, ධම්මායතනය, යන බාහිරායතනයෝ සදෙනාය–ඔහු කවරහෙයකින් සොරු වැන්නෝදයත් ? යම්සේ සොරු ගෙයක් වට කොට සිට ගිනි තිබා අඹගසා බඩු සහිතව දෙරට ගියවුන් අල්වා මරා බඩු ගණිද්ද බඩු රහිතව නික්ම ගියවුන් අල්වා බැඳ දුසි භොගයෙන් අනුභව කෙරෙද්ද එපරිද්දෙන්ම මේ රූපශබ්දාදිවූ බාහිරායතනයෝ සදෙනාද රාග නමැති ගින්නෙක ද්වෙෂ නමැති ගින්නෙක මොහ නමැති ගින්නෙක ජාති නමැති ගින්නෙක ජරා නමැති ගින්නෙක ව්‍යාධි නමැති ගින්නෙක මරණ නමැති ගින්නෙක ශොක නමැති ගින්නෙක පරිදෙව නමැති ගින්නෙක දුක් දොම්නස් නමැති ගින්නෙක උපායාස නමැති ගින්නෙක යන මේ එකොළොස් ගින්නකින් චක්ෂුරාදිවූ ආධ්‍යාත්මිකායතනයන් සදෙනා ගිනිඅවුලා මුළුකොට එම රාගාග්නි ජනිත දාහයෙන් ප්‍රාණඝාතාදි දසඅකුසල් සිඩකරවා රාජචොරාදීන්ගෙන් නිග්‍රහ කරවා සතර අපායෙහි හෙළති එහින් පිටත් භවගාමී කුසල් අකුසල් කළවුන් සසරින් මිදී යා නොදී තමන් අයති කෙරෙති එබැවින් මේ වර්ණාදි බාහිරායතනයෝ සදෙනා සොරුන් සදෙනා වැන්නෝය—ඒ සොරුන් කෙරෙහි භයගෙණ ඇර යන්නාක්මෙන් මොවුන් කෙරෙහිද ආලය හැරිය යුත්තේය—සර්පාදීන් කෙරෙහි භයගෙණ දිවන්නාවූ පුරුෂයා විසින් පැමිණෙනලද සතර ගව්වක් පළල ඇති සතර ගව්වක් ගැඹුර ඇති ගංවතුරු සතරක් එක්වූ තැනක ඔරු ඒදඬු ආදිවූ දෙයක් නැති ගඟාව නම්, කාමොඝය භවොඝය දිට්ඨොඝය අවිජ්ජොඝ යයි යන අකුශලයෝ සතරදෙනම සතර ගංවතුරෙක, ඔහු කවරහෙයකින් ගංවතුරු වැන්නෝදයත් ? ගඟ යම්සේ වැටුන වැටුනන් ගළ යානොදේද පිහිටක් නම් නැත්තේද එමෙන් කාමතෘෂ්ණාවය භවතෘෂ්ණාවය මිථ්‍යාදෘෂ්ටිය මොහය යන මොහු සතරදෙන තමන් වසඟවූවන් සසරින් ගොඩ යා නොදී කිසි පිහිට කුදු ලැබගත නොදී සතර අපායෙහිම පිහිටුවති එසේහෙයින් ගංවතුරු වැන්නෝය.

උපද්‍රවය ඇති ගඟ මෙගොඩනම් කවරේද යතහොත්?

“රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං සමනුපස්සති, රූපස්මිං වා අත්තානං සමනුපස්සති, අත්තනි වා රූපං සමනුපස්සති” යනාදීන් දක්වනලද රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සඞ්ඛාරාස්කන්ධය, විඥානස්කන්ධය, යන පස්කදෙහි එකිඑකි කදකට සතරක් සතරක් බැගින් විස්සක් පමණවූ සක්කායදෘෂ්ටිය මෙගොඩ නම් වන්නේය, ඒ කවරහෙයින්දයත්? ගඟෙහිද මෙගොඩ සිටි සත්වයාට එගොඩ බට නොහැක්කේද එමෙන් මේ කායෙහි මමය මාගේ

යයි යන ග්‍රහණය සක්කායදෘෂ්ටිය නොහැර සිටි සත්ත්වයාට චතුරොඝයෙන් එතෙරව නිවන් දක්ක නොහැකි හෙයින් ගඟ මෙගොඩ ගොඩ නම් වෙති.

යම්සේ ඒ ගංතෙරට පැමිණි සොරාගේ අත පය කොරවූයේනම් කවරේදයත්? යම්සේ අත පය කොරවූව තණකොල ආදිය එක්කොට පහුරක් බැඳ ගඟින් එතෙර යන්ට උපාය නොකොට හැකිවේද එමෙන් යමෙක්හට ශ්‍රද්ධාව නැද්ද රක්‍ෂාකරණ ශීලයෙක් නැද්ද ඇසූ බුදු බණක් නැද්ද පුරුදු කළ ධ්‍යානයෙක් නැද්ද සිතෙහි වැඩූ අනිත්‍ය දුඃඛාදි විදර්ශනා ප්‍රඥවෙක් නැද්ද ඔහු විසින් අෂ්ටාඞ්ගිකමාර්ගනමැති පහුර බැඳ චතුරොඝ නමැති ගඟින් එතෙරව අභයපුරය වැනි නිවන් දක්ක නොහෙන බැවින් අත්පා කොරවීමහා සමානය, එබැවින් ශ්‍රද්ධාශීලාදී පඤ්චධර්මාදීන්ගේ අඛණ්ඩනොවීම අත්පා කොරනොවීම හා සමානය–යම්සේ ගංතෙරට පැමිණි පුරුෂයා නයින් සතරදෙනාද වධකයන් පස්දෙනාද මිත්‍ර වධකයාද ගම්පහරණ සොරුන් සදෙනාද ලුහුබැඳ අවුත් අල්වන හෙයින් මදකුත් පමානොවිය යුතුවේද, එමෙන් ලොභ ද්වෙෂ මොහ මදමාන මාත්සර්‍ය්‍යාදි සතුරන් වසඟවූවාහු විසින් සසරින් ගොඩයාම නොපිළිවන් හෙයින් මේ බුද්ධොත්පාද නමැති ගංතෙරට පැමිණි සත්ත්වයන් විසින් ඒ අකුසල් නමැති කෙළෙස් සතුරන්ට අසුනොව නුවනින් යුක්ත පණ්ඩිත ජනයන් විසින් සසරදුකින් එතෙරව නිවන් දැකීමට දිවාරාත්‍රි දෙක්හි අප්‍රමාදවම වීර්‍ය්‍යකටයුත්තේ යයි කී නියායි.

ඒ අත්පා කොරනුවූ පුරුෂයා විසින් ගඟින් එතෙර වීමට බැඳගත් පහුරනම් ශ්‍රද්ධාශීලාදි ගුණයෙහි පිහිටි සත්පුරුෂ සෙවනයෙහි ලත් සත්ත්වයන් විසින් චතුරොඝ නිස්තරණය පිණිස රැස්කරණලද සම්මා දිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි යයි කියනලද ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය වන්නේය.

එහි සම්‍යක් දෘෂ්ටියනම් කවරේදයත්? දුන් දනෙහි විපාක නැත කළ කුසල් අකුසල්හි විපාක නැත මෑනියන් පියානන් කෙරෙහි කළ ආදර අනාදරයෙහි විපාක නැතැයි යනාදි මිථ්‍යාදෘෂ්ටියයි ඊට විරුද්ධ වූයේ සම්‍යක් දෘෂ්ටිනම් වෙයි, නොහොත් යමෙක් සම්‍යක් දෘෂ්ටිය මේ සම්‍යක් දෘෂ්ටියයි කියා දනීද මිථ්‍යාදෘෂ්ටිය මේ මිථ්‍යාදෘෂ්ටියයි කියා දනීද සම්‍යක් කල්පනාව මේ සම්‍යක් කල්පනාවයයි කියා දනීද මිථ්‍යාකල්පනාව මේ මිථ්‍යාකල්පනාවයයි කියා දනීද සම්‍යක් වචනය මේ සම්‍යක් වචනයයි කියා දනීද මිථ්‍යාවචනය මේ මිථ්‍යාවචනයයි කියා දනීද සම්‍යක් කර්මාන්තය මේ සම්‍යක් කර්මාන්තයයි කියා දනීද මිථ්‍යා

කම්මාන්තය මේ මිථ්‍යාකම්මාන්තයයි කියා දනීද මිථ්‍යාආජීව ය මේ මිථ්‍යාආජීවයයි කියා දනීද සම්‍යක් ආජීවය මේ සම්‍යක් ආජීවයයි කියා දනීද මිථ්‍යාව්‍යායාමය මේ මිථ්‍යාව්‍යායාමයයි කියා දනීද සම්‍යක් ව්‍යායාමය මේ සම්‍යක් ව්‍යායාමයයි කියා දනීද මිථ්‍යාසතිය මේ මිථ්‍යාසතියයි කියා දනීද සම්‍යක් සතිය මේ සම්‍යක් සතියයි කියා දනීද මිථ්‍යාසමාධිය මේ මිථ්‍යාසමාධියයි කියා දනීද සම්‍යක් සමාධිය මේ සම්‍යක් සමාධියයි කියා දනීද ඒ මේ සම්‍යක් දෘෂ්ටිනම් වේ-නොහොත් යමෙක් මෙලෝ නැත පරලෝ නැත දෙවියෝ නැත බුදුහු නැත යනාදීන් සිතනුයේ මිථ්‍යාදෘෂ්ටි නම ඊට විපරීතවූයේ සම්‍යක් දෘෂ්ටිනම් වෙයි.

සම්‍යක් කල්පනානම් කවරේදයත්? කාමකල්පනාවට විරුඬවූ නෛෂ්ක්‍රම්‍ය කල්පනාවද ව්‍යාපාද සංකල්පනාවට විරුඬ අව්‍යාපාද සංකල්පනාවද විහිංසා කල්පනාවට විරුඬවූ අවිහිංසා කල්පනාවද යන මේ සම්‍යක් කල්පනානම් වෙයි.

සම්මාවාචානම් කවරේදයත්? මුසාවාදයට විරුඬවූ සත්‍යවචනයද පෛශුන්‍ය වචනයට විරුඬවූ සමග කරණ තෙපුලද පරුෂ වචනයට විරුඬවූ ප්‍රියවචනයද සම්ඵප්‍රලාපයට විරුඬවූ ධර්මකථනයද යන මේ සම්‍යක් වචනනම් වෙයි.

සම්‍යක් කර්මාන්තනම් කවරේදයත්? ප්‍රාණඝාතයට විරුඬවූ ප්‍රාණඝාත විරතියද අදත්තාදානයට විරුඬවූ අදත්තාදාන විරතියද අබ්‍රහ්මචරියාවට විරුඬවූ අබ්‍රහ්මචරියා විරතියද යන මේ සම්‍යක් කර්මාන්තනම් වෙයි.

සම්‍යක් ආජීවනම් කුහණලපනාදි එක්විස්සක් අනේසනයෙන් ලොභ උපදවා එයින් ජීවත්වීම මිථ්‍යාආජීවනම් වෙයි, ඊට විරුඬවූයේ සම්‍යක් ආජීවනම් වෙයි.

සම්‍යක් ව්‍යායාමනම් සම්‍යක් දෘෂ්ටියද සම්‍යක් කල්පනාවද සම්‍යක් වචනයද සම්‍යක් කර්මාන්තයද සම්‍යක් ආජීවයද සම්‍යක් සතියද සම්‍යක් සමාධියද යන මොවුන්ගේ වැඩීමට කරණ උත්සාහය සම්‍යක් ව්‍යායාමනම් වෙයි.

සම්‍යක් දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටිය ආදි මාර්ගාංගත ධර්මයන් සොළොස් දෙනා සිහිනොහැර හැම කල්හිම පැවැත්වීම සම්මාසතිනම් වෙයි.

මොවුන් සත්දෙනාගේ සම්පූර්ණතාවෙන් සිඬකරණ රූපාවචර ධ්‍යාන අරූපාවචරධ්‍යාන සම්මාසමාධිනම් වෙයි—මේ අෂ්ටාඞ්ගික මාර්ගයෙහි සම්‍යක් දෘෂ්ටියයි කියනලද ප්‍රඥව වැඩුනුකල්හි මිථ්‍යාදෘෂ්ටිය දිරීමට යෙයි ඒ නිසා උපදන අකුශලයෝද දිරා යෙති නොයෙක් කුශලයෝද පහළවෙති-සම්‍යක් කල්පනාවයයි කියනලද අලොභය මෛත්‍රියහා කාරුණාවය යන මොවුන්ගේ වැඩීම නිසා මිථ්‍යාකල්ප

භාවයයි කියනලද ලොභ කල්‍පනාවද වෛෂ කල්‍පනාවද විහිංසා කල්‍පනාවද යන අකුශලයෝ දිරා යෙති ඔවුන් දිරා යාමෙන් ඔවුන් නිසා උපදනා අකුශලයෝද දිරා යෙති නොයෙක් කුශලයෝද පහළ වෙති—සම්‍යක් වචනයෙන් මිථ්‍යාවචනයයි කියනලද මුසාවාද පෛශුන්‍ය පරුෂවචන නිරර්ථක වචනයයි කියනලද අකුශලයෝ දිරා යෙති ඔවුන් දිරා යාමෙන් ඔවුන් නිසා උපදනා අකුශලයෝද දිරා යෙති නොයෙක් කුශලයෝද පහළවෙති—සම්‍යක් කර්මාන්තය නිසා මිථ්‍යාකර්මාන්තයයි කියනලද ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරයයි කියනලද අකුශලයෝ දිරායෙති ඔවුන් දිරා යාමෙන් ඔවුන් නිසා උපදනා අකුශලයෝද දිරායෙති නොයෙක් කුශලයෝද පහළ වෙති—සම්‍යක් ආජීවයෙන් මිථ්‍යාජීවයයි කියනලද කුහණලපනාදී අකුශලයෝ දිරායෙති ඔවුන් දිරා යාමෙන් ඔවුන් නිසා උපදනා අකුශලයෝද දිරායෙති නොයෙක් කුශලයෝද පහළවෙති-සම්‍යක් සති යෙන් මිථ්‍යාසතියයි කියනලද සම්‍යක්ආජීවය මිථ්‍යාජීවාදී ධර්මයන්ගේ සිහිනැති බව ආදි අකුශලයෝද දිරායෙති ඔවුන් දිරායාමෙන් ඔවුන් නිසා උපදනා අකුශලයෝද දිරායෙති නොයෙක් කුශලයෝද පහළ වෙති—සම්‍යක් සමාධියෙන් මිථ්‍යාසමාධියයි කියනලද තෘෂ්ණාදෘෂ්ටි අවිද්‍යාවෝද දිරායෙති ඔවුන් දිරායාමෙන් ඔවුන් නිසා උපදනා අකුශලයෝද දිරායෙති නොයෙක් කුශලයෝද පහළවෙති-මෙහි යමක් හට සම්‍යක් දෘෂ්ටිය බලවත්ව පහළවූයේවීනම් ඕහට සම්‍යක් කල්‍පනාව පහළවෙයි, යමක්හට සම්‍යක් කල්‍පනාව පහළවූයේවීනම් ඕහට සම්‍යක් වචනය සිඩවෙයි, සම්‍යක් වචනය යමක්හට සිඩවූයේවීනම් ඕහට සම්‍යක් කර්මාන්තය සිඩවෙයි, සම්‍යක් කර්මාන්තය යමක්හට සිඩවූයේවීනම් ඕහට සම්‍යක් ආජීවය සිඩවෙයි, යමක්හට සම්‍යක් ආජීවය සිඩවූයේවීනම් ඕහට සම්‍යක් ව්‍යායාමය සිඩවෙයි, යමක් හට සම්‍යක් ව්‍යායාමය සිඩවූයේවීනම් ඕහට සම්‍යක් සතිය සිඩවෙයි යමක්හට සම්‍යක් සතිය සිඩවූයේවීනම් ඕහට සම්‍යක් සමාධිය සිඩ වෙයි, මෙසේවූ අෂ්ටාඞ්ගික මාර්ගයෝ රැස්කිරීමෙන් යමක්හුගේ සිත පිරුණේවීනම් ඕහට නිවන් සිඩවනහෙයින් චතුරොඝයෙන් එතර වීමට මොහු පසුරක් වැන්නෝය.

ඒ පසුර අතින් පයින් පැදගෙණ යනවානම් කවරේදයත්? නූපන් අකුසල් නූපදවමින් උපන් අකුසල් පහකෙරෙමින් නූපන් කුසල් උපදවමින් උපන් කුසල් නැවත නැවත වැඞීමය යන සතර සම්‍යක් ප්‍රධානයයි කියනලද වීර්‍යයෙන් මේ අෂ්ටාඞ්ගික මාර්ගය වැඞීමෙහි පමා නොවීමයි-ඒ ගඟෙහි ගව්වක් පමණ ගියතෙන සැතැප්මෙ කැයි කියේනම් ගොත්‍රභූඥානයට අනතුරුව කාමොඝය යන චතුරු

ඉක්ම උපන් ශ්‍රොතාපත්ති මාර්ගඥානය හා ඵලඥානය ලදින් මනුෂ්‍ය ලොකයෙහි සත්ජාතියක් තබා වඩා ඉපදීමක් නැතුව සසරින් මිදීමක් නැතුව සසරින් මිදී සිටිතෙනක හෙවත් පළමුවෙන් නිවන් දුටු තෙනය.

එහි සිට ආපසු බැලූයේවීනම් කවරේදයත්? ඒ ශ්‍රොතාපත්ති මාර්ග ඥානයෙන් සක්කාය දෘෂ්ටියද විචිකිච්ඡාවද සීලබ්බතපරාමාසයද අපායගාමිවූ කාමරාග පටිඝසංයොජනයෝද කෙලශයන් කෙරෙහි දෘෂ්ටි විචිකිච්ඡා දෙදෙනද මිච්ඡත්තයන් කෙරෙහි මිථ්‍යාදෘෂ්ටිය මුසාවාදය මිථ්‍යාකර්මාන්තය මිථ්‍යාආජීවය යන මොහුද විපර්‍යාසයන් කෙරෙහි අනිත්‍යයෙහි නිත්‍යය අනාත්මයෙහි ආත්මයයි ගත් සංඥ දෘෂ්ටි විපර්‍යාසයද දුඃඛයෙහි සැපයයි යන දෘෂ්ටිවිපර්‍යාසයද ආශ්‍රවයන්කෙරෙහි දෘෂ්ටාශ්‍රවයද නීවරණයන් කෙරෙහි විචිකිච්ඡා නීවරණයද අනුසයන් කෙරෙහි දෘෂ්ටි විචිකිච්ඡානුසයද අකුශල කර්මපථයන් කෙරෙහි ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මුසාවාදය මිථ්‍යාදෘෂ්ටිය යන මොහු පස්දෙන නැසෙන්නාහුවෙති එබැවින් ඒ නැසුනාවූ අකුශලයන් ප්‍රත්‍යවෙක්ෂාකිරීම පසුවූ සතුරන් බැලීම නම් වන්නේය—සෙසු මාර්ග තුණිනුත් මෙතෙක් කෙලශයෝ නැසිය යුත්තාහුයයි ප්‍රත්‍යවෙක්ෂාකිරීම ඉදිරි බැලීම නම් වන්නේය.

නැවත "අච්ජරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භාවං න වණ්ණෙමි" යි අසුරු සැණකුත් සසර සිටීම යහපත් කොට නොකියමි වදාළ අවවාදය සිත තබා භාවනා කොට මිනිස්ලොව එක ජාතියක් තබා වඩා ඉපදීමක් නැතිකරණ සකෘදගාමිමාර්ගයයි කියනලද දෙවෙනි ගව්ව ගෙවා ලත් සැතැප්මහා සමාන වන්නේය—ඒ සකෘදගාමි මාර්ගයෙනුත් ඖදාරිකවූ කාමරාග සංයොජනාදි අකුශලයෝද නැසෙති එසිනුදු නැසුනු අකුශලයන් ප්‍රත්‍යවෙක්ෂාකිරීම ආපසු බැලීමනම් වන්නේය—නොනැසුනු අකුශලයන් ප්‍රත්‍යවෙක්ෂාකිරීම ඉදිරි බැලීමහා සමාන වන්නේය–නැවත කාමධාතුයෙහි ඉපදීම නොකැමැතිව භාවනා කොට අනාගාමි මාර්ගය ලැබීම තුන්වෙනි සැතැප්මහා සමාන වන්නේය—ඒ මාර්ගයෙනුත් සංයොජනයන් කෙරෙහි රූපරාග අරූපරාග සංයොජනයෝ පස්දෙනද කෙලශයන් කෙරෙහි ද්වෙෂයද මිච්ඡත්තයන් කෙරෙහි මිච්ඡාසංකප්ප පිසුනාවාච ඵරුෂාවාචයෝද විපල්ලාසයන් කෙරෙහි අශුභයෙහි ශුභයයි යන සංඥවිපර්‍යාසයෝද අනුසයන් කෙරෙහි කාමරාගපටිඝානුසයෝද කර්මපථයන්කෙරෙහි පිසුනාවාචා ඵරුෂාවාචා ව්‍යාපාද යන මොහු තුන්දෙනද නැසෙති එබැවින් ඒ නැසුනු අකුශලයන් ප්‍රත්‍යවෙක්ෂාකිරීම ආපසු බැලීමනම් වන්නෝය—ඒ මාර්ගයෙන් නොනැසුනු අකුශලයන් ප්‍රත්‍යවෙක්ෂාකිරීම ඉදිරි බැලීමහා සමාන වන්නේය—නැවත සියලු භවයෙහි ඇල්ම

දුරුකොට භාවනාකිරීමෙන් සතරවැනිව නිවන් දැකිම යයි කියන ලද අභීත් මාර්ගය ලැබීම සතරගව්වම ගෙවා පරතෙරට පැමිණී නෙ න නම් වන්නේය—ඒ අභීත් මාර්ගයෙනුත් සංයොජනයන් කෙරෙ හි රූපරාග අරූපරාගාදි සංයොජනයෝ පස්දෙනද කෙලශයන් කෙ රෙනි ලොභය මොහය ථිනය මිඛය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යන මොවුන්ද මිච්ඡත්තයන් කෙරෙහි සම්ඵප්‍රලාපය මිථ්‍යාව්‍යායාමය මිථ්‍යාසතිය මිථ්‍යාසමාධිය යන මොහුද විපල්ලාසයන් කෙරෙහි දුඃඛයෙහි සැපය යන සංඥාවිත්ත විපල්ලාසයෝද නීවරණයන් කෙරෙහි ථීන මිඛඋද්ධච්ච නීවරණයෝද අනුසයන් කෙරෙහි මානභවරාග අවිජ්ජානු සයෝද කර්මපථයන් කෙරෙහි සම්ඵප්‍රලාප අභිද්‍යාවෝ දෙදෙනද යන සකලකෙලශයෝද නැසෙන්නාහු වෙති ඒ නැසුනු අකුශලයන් ප්‍රත්‍ය වෙක්ෂාකිරීම ආපසු බැලීම නම් වන්නේය—ඉදින් සසර දුකින් මිදීමට කටයුතු භාවනාවක් නැතිහෙයින් සියලු භවදුඃඛයම මුල් සිඳ නැසූ හෙයින් අෂ්ටාඞ්ගික මාර්ගය වැඩීමෙහි නිරුත්සාහවීම නැගිපසුර යටි ගඟට දැමීම නම් වන්නේය—ඒ සසර මුල්සිඳ සතර වැනිව දුටු ශා න්තවූ ප්‍රණීතවූ අජරවූ අමරවූ අමෘත මහානිර්වාණයම අභයපුර නම් වන්නේය—නරක තිර්‍යග්ප්‍රෙත අසුරකාය යන සියලු ගතියෙන් මිදී ලද් දාවූ රහත් බව උතුම් බ්‍රාහ්මණවංශයට පැමිණීම නම් වන්නේය—කිසි කාලෙකත් නොලත් අභීත් ඵල සමාපත්ති සුවවිඳීම අභිෂෙක ලත් රජ සුව විඳීම නම් වන්නේය.

මෙසේ සකල ලොකනායකවූ සමස්ත ලොකවාසීන් කෙරෙහි නිර වධිව පතළ කරුණා ඇති නව අරහාදි ගුණයෙන් සමස්තලොකප්‍රසි ධවූ භාග්‍යවත් සර්වඥරාජොත්තමයානන් වහන්සේ මේ ‘ආසිවිසොපම’ සූත්‍රාන්තධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාළසේක.

එබැවින් ලොවුතුරා බුදුන්විසින් වදාළ අවවාදයෙහි පිහිටා දිවාරාත්‍රි දෙක්හි අප්‍රමාදව මතු අමාමහනිවන් දක්නට උත්සාහ කටයුතු.

**ආශිවිෂොපම සූත්‍ර විශෙෂාර්ථ භාවසන්නය**

**නි මි.**

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 25 | අනුබද්ධා | අනුබද්ධො |
| 2 | 20 | භික්ඛවෙතිණ්ණකාඛ | භික්ඛවෙපුරිසොතිණ්ණකාඛ |
| 4 | 3 | ආශීවීෂොපම | ආශීවිෂොපම |
| 5 | 2 | කාලෙන කාලං | තෙ, තාවිසින්; කාලෙන කාලං |
| ” | 20 | ආශීවීෂයෝ සතරදෙනාට | ආශීවිෂයන් සතරදෙනා කෙරෙන් * |
| 6 | 21 | පරිමසෙසයාය, | පරීමසෙයාය, |
| 7 | 4 | මහ | මහා |
| ” | 23 | කාෂඨය | කාෂ්ටය * |
| ” | 31 | තණ | තිණ |
| 8 | 8 | උග්ගතෙජානං | උග්ගතෙජා |
| ” | ” | ඝොරවිසානං | ඝොරවිසා |
| ” | 10 | පඨවිධාතු, සල්බද් ලක්ෂණ පෘථුවිධාතුය; | පඨවිධාතුයා, සම්බන්ධ ලක්ෂණ පෘථිවිධාතුය; |
| ” | ” | ආපොධාතු, | ආපොධාතුයා, |
| ” | 11 | තෙජොධාතු, | තෙජොධාතුයා, |
| ” | 12 | වායොධාතු, | වායොධාතුයා, |
| ” | 31 | සඩායතන | ෂඩායතන |
| ” | 35 | තං, | නං, |
| ” | ” | රිත්තකෙඤුව | රිත්තකකෙඤුව |
| 9 | 23 | කා්යෙ, | කායො, |
| 17 | 31 | හැක්කෝද | හැක්කේද |
| 18 | 17 | පැමිණෙන්නෝය | පැමිණෙන්නේය * |
| ” | 25 | සායත්වට | සත්වයාට |
| 19 | 13 | භූතිකම්මය | භූතිකාමය * |
| 21 | 24 | ශෙලශමාදිකාරාදි | ශෙලශමා විකාරාදි |
| 24 | 1 | පටලය | මොහනමැති පටලය |